BUILDING COMPETENCIES

# ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය

# වාර්ෂික වාර්තාව 2012


| පටුන | පිටු අංකය |
|---|---|
| ආයතනික සාරාංශය | 04 |
| මූල්‍ය ප්‍රගතියේ විශේෂ අවස්ථා | 05 |
| ආයතනික දැක්ම, මෙහෙවර සහ අරමුණු | 07 |
| අප ආ මග | 09 |
| පාලක සභාව | 12 |
| ආයතනය හැඳින්වීම | 13 |
| මානව සම්පත් කළමනාකරණය | 14 |
| ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (NSBM) | 22 |
| අපගේ ක්‍රියාකාරකම් | 28 |
| ආයතනික සමාජ සත්කාරයන් | 30 |
| ලගාකර ගැනීම් | 31 |
| අනාගත ගමන්මග | 34 |
| අංශවල ව්‍යූහය | 34 |
| ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය | 34 |
| කළමනාකරණ තොරතුරු පද්ධති අංශය | 38 |
| ප්‍රාදේශීය මධ්‍යස්ථාන | 40 |
| පුස්තකාලය සහ ප්‍රලේඛන මධ්‍යස්ථානය | 46 |
| වාර්ෂික ගිණුම් පිළිබඳව විගණකාධිපති වාර්තාව | 50 |
| මූල්‍ය ප්‍රකාශණ (වාර්ෂික ගිණුම්) | 57 |
| විගණකාධිපතිගේ ගුණදොස් දැක්වීමට පිළිතුරු | 100 |


NIBM
National
Institute of
Business
Management

NIBM

NIBM

தேசிய வியாபார முகாமை நிறுவனம்

NIBM








Y 2010



# වාර්ෂික වාර්තාව 2012

NIBM

BUILDING COMPETENCIES

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

Did you Know NIBM

# Did you Know NIBM

- රජය සතු, ස්වමූල්‍යන ආයතනයක් බවත්,
- යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බවත්
- 2012 වර්ෂයේ දී සිසුන් 14,000 කට පමණ අධ්‍යාපනය ලබා දී ඇති බවත්
- 44 වසරක ප්‍රෞඪ ඉතිහාසයක් (1968-2012) ඇති බවත්
- නව උපාධි පිරිනමන ආයතනයක් දක්වා තම නිම් වළලු පුළුල් කර ඇති බවත් - NSBM ශ්‍රී ලංකාවේ පළමු හරිත විශ්වවිද්‍යාලය බවත්
- ඉහළ පිළිගැනීමක් ඇති විදේශ විශ්වවිද්‍යාල සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරන බවත්
- ශ්‍රී ලංකාව තුළ කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනය සඳහා අසමසම අවස්ථාවන් ලබා දෙන බවත්
- පූර්ණ සේවා නියුක්ති ශක්‍යතාවයෙන් යුතු උපාධිධාරීන් බිහි කරන බවත්
- 2011 හා 2012 වසරවල ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් හොඳම රාජ්‍ය සේවා අංශයේ ආයතනය ලෙස පිළිගෙන ඇති බවත්, ඔබ දන්නෙහි ද?

# මූල්‍ය ප්‍රගතියේ විශේෂ අවස්ථා

මුළු ආදායම
රු. 000'

## 1020

26% වර්ධනය




මුළු වියදම
රු. 000'

## 599

23% වර්ධනය




ශුද්ධ ලාභය
රු. 000'

## 421

30% වර්ධනය




මුළු වත්කම්
රු. 000'

## 1,775

24% වර්ධනය






# PROGRAMME HIGHLIGHTS

පැවැත්වූ වැඩසටහන් - ප්‍රධාන කාර්යාලය




පැවැත්වූ වැඩසටහන් - ප්‍රාදේශීය මධ්‍යස්ථාන




සිසුන් ප්‍රමාණය - ප්‍රධාන කාර්යාලය




සිසුන් ප්‍රමාණය - ප්‍රාදේශීය මධ්‍යස්ථාන



## අපගේ දැක්ම

"ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ව්‍යාපාරික අධ්‍යාපන ආයතනය බවට පත්වීම."



## අපගේ මෙහෙවර

"අපි පුහුණුව, අධ්‍යාපනය සහ උපදේශනය මගින් ජනතාවගේත්, සංවිධානවලත් නිපුණතා සංවර්ධනය කිරීමේ කාර්යයෙහි නිරතව සිටින්නෙමු.

## ආයතනයේ අරමුණු

ආයතනයේ අපේක්ෂිත ව්‍යවස්ථාපිත අරමුණු පහත පරිදි වේ.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්මික හා වාණිජ ආයතනවල කළමනාකරුවන් හා අධීක්ෂණ නිලධාරීන්ගේ සේවය දියුණු කිරීම.
- කළමනාකාරීත්වය සමග නිර්මාණාත්මක ලෙස සහභාගි වීමට සේවකයන් පුහුණු කිරීම සහ අධ්‍යාපනයක් ලබා දීම.
- කළමනාකරණ විශේෂඥ සේවාවන් ලබාදීම, කාර්යසාධන ප්‍රමිති ස්ථාපනය කිරීම හා ඵලදායිතාව ඉහළ නැංවීම.
- කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස මානව දායකත්වය ප්‍රශස්ත මට්ටමට නැංවීම සඳහා වෙනත් ක්‍රියාකාරකම් ඉටුකිරීම.
- පරිසරය වඩා හොඳින් අගය කිරීම සඳහා අදාළ සමාජ ආර්ථික සංසිද්ධීන් සහ කළමනාකරණ අංශ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ දත්ත එකතු කිරීම.
- බාහිර සංවිධාන සඳහා කළමනාකරණ තොරතුරු සේවා ලබාදීම හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙහි සේවක පිරිස් පුහුණු කිරීම.
- සංස්ථාපිත අංශයට තම පද්ධති, පරිපාටි හා කාර්ය ක්‍රම දියුණු කිරීම, සැලසුම්කරණ කාර්යයන්ට සහාය වීම හා සාමාන්‍යයෙන් වෙනස් වන පාරිසරික සාධකයන් නිසා මුහුණපෑමට සිදුවන අභියෝගවලට මුහුණ දීම සඳහා උපදේශක සේවා සම්පාදනය.
- අධ්‍යාපනය හා පුහුණු වැඩසටහන් මගින් සංවිධානවල ඵලදායිතාව දියුණු කිරීමට පහසුකම් සැලසීම.

## අපගේ ඉලක්ක

- වෘත්තිය දැනුම හා සුදුසුකම් අපේක්ෂා කරන පුද්ගලයන්ට අදාළ විෂයයන් පිළිබඳ උසස් මට්ටමේ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනයක් හා උපදෙස් ලබාදීම.
- මනාව ව්‍යුහගත කළ පුහුණු වැඩසටහන් මගින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවිධානවල කළමනාකරුවන් හා අධීක්ෂණ නිලධාරීන්ගේ නිපුණතා වර්ධනය කිරීම.
- කළමනාකරණයට නිර්මාණාත්මක හා ඵලදායී අයුරින් සහභාගි වීම සඳහා සේවකයන්ට පුහුණුව හා අධ්‍යාපනය ලබාදීම.
- අධ්‍යාපනය හා පුහුණු වැඩසටහන් මගින් සංවිධානවල ඵලදායිතාවය වර්ධනය කිරීමට පහසුකම් සැලසීම.
- රාජ්‍ය, පොදු හා පෞද්ගලික අංශයේ සංවිධානවල කාර්යසාධන ප්‍රමිති ස්ථාපනය හා සංවිධානවල සංවර්ධනය සඳහා මානව සම්පත්වල දායකත්වය ප්‍රශස්ත මට්ටමට පත්කිරීමට කළමනාකරණ උපදේශනය හා වෙනත් උපදේශන සේවා ලබාදීම.

**අපගේ සේවා සැපයීම පහත පරිදි වේ.,**

- **අපගේ සේවාලාභීන් සඳහා,**

  අ) පුද්ගලයන් රැකියාභිමුක, පිළිගැනීමට පාත්‍ර වන සුදුසුකම් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන අතරම ඔවුන්ගේ නිපුණතා වර්ධනය කිරීම.

  ආ) සංවිධාන - සංවිධානවල කාර්යසාධන ශක්‍යතා වර්ධනය සඳහා හැකියාවන් ශක්තිමත් කිරීම.

- **අපගේ කාර්ය මණ්ඩලය වෙත**

  වෘත්තීය නිදහස, කාර්යසාධනය පදනම් කරගත් ප්‍රදාන, මිත්‍රශීලී වැඩ පරිසරය හා ආයතනය සමඟ ඉගෙනීමට හා වර්ධනයට අවස්ථා සැපයීම.

- **අපගේ බාහිර ආචාර්ය ගණයට,**

  පිළිගැනීම සාමාන්‍ය මට්ටමට වැඩි ප්‍රදාන හා ජාලගත වීමට අවස්ථා ලබාදීම.

- **අපගේ හවුල්කරුවන් වෙත,**

  ගෝලීය මට්ටමේ පහසුකම් හා විශේෂඥ දැනුම ලබාදීම.

- **අපගේ සමාජයට,**

  දැනුම බෙදාහැරීම හා ඵලදායිතා වර්ධනය.

පියසටහන්

# අප ශ්‍රී ලංකාවේ හොඳම අධ්‍යාපන ආයතන අතරින් එකක් බවට පත්වූයේ කෙසේ ද?




## 1968

කළමනාකරණ සංවර්ධන හා ඵලදායිතා මධ්‍යස්ථානය *(MDPC)* පිහිටුවන ලදී.

## 1971

කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ කළමනාකරණ සංවර්ධන හා ඵලදායිතා මධ්‍යස්ථානය ස්වාධීන සංවිධානයක් ලෙස ස්ථාපිත කරන ලදී.



## 1972

කළමනාකරණ සංවර්ධන හා ඵලදායිතා මධ්‍යස්ථානය ජාතික කළමනාකාරීත්ව ආයතනය *(NIM)* යන නාමය යටතේ ක්‍රියාත්මක වීම ආරම්භ කරන ලදී,



## 1973

විජේරාම මාවතේ පිහිටි ඉඩම මිලදී ගන්නා ලද අතර ගොඩනැගිල්ල ඉදිකිරීම ජෙෆ්රි බාවා මහතාගේ අධීක්ෂණය යටතේ සිදු විය.



## 1975

පළමු ඩිප්ලෝමා පාඨමාලාව - ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ඇරඹිණි.



## 1976

මෙම අධ්‍යාපන ආයතනය ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ලෙස සංස්ථාපිත කරන ලදී.

## 1980

පළමු පරිගණක පද්ධති නිර්මාණකරණය පිළිබඳ ඩිප්ලෝමාව අරඹන ලදී.




## 1986

පළමු ප්‍රාදේශීය මධ්‍යස්ථානය කුරුණෑගල ස්ථාපිත කරන ලදී.

## 1991

මෙම අධ්‍යාපන ආයතනය රාජ්‍ය අංශයේ ස්වමූල්‍යන සංවිධානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය පිළිබඳ පාර්ලිමේන්තු පනත සංශෝධනය කරන ලදී.



## 1993

වෙනස් වන පරිසරයක් තුළ ඵලදායිතාව ඉහළ නැංවීම' යන තේමාව යටතේ වාර්ෂික සම්මේලනය පවත්වමින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය තම 25 වන සංවත්සරය සමරනු ලැබී ය..




## 1996

තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව අයර්ලන්තයේ ඩබ්ලින් විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතාවයෙන් ආරම්භ කරන ලදී.

-මධ්‍යම පළාත තුළ ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී.




## 1999

අයර්ලන්ත ජාතික විශ්වවිද්‍යාලයේ තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ප්‍රදානය කිරීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයනයේ පළමු උපාධි ප්‍රධානෝත්සවය පවත්වන ලදී.



## 2000

ව්‍යාපාර කළමනාකරණයට අදාළ සියලු කරුණු පිළිබඳ සභාවට උපදෙස් දීම සඳහා 1991 අංක 28 දරණ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනත යටතේ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපන මණ්ඩලය ස්ථාපිත කිරීම.

## 2003

ආයතනයේ තත්ත්වය හා ඵලදායිතාව ඉහළ නැංවීමට දායක වූ ජපන් *S 5* සංකල්පය ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය තුළ ක්‍රියාවට නංවන ලදී.




## 2007

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ශිෂ්‍යයෝ ව්‍යාපාර පරිපාලනය, මූල්‍ය, මානව සම්පත්, තොරතුරු පද්ධති කළමනාකරණය කාර්ය සම්පාදන හා කාර්මික කළමනාකරණ ආදී විද්‍යාවේදී උපාධි හැදෑරීමට සුදුසුකම් ලැබූහ.

-තොරතුරු පද්ධති කළමනාකරණ අංශය එමගින් ලබාදෙන උසස් තත්ත්වයේ අධ්‍යාපනය වෙනුවෙන් *ISO 9001:2000* සහතිකය ලබා ගන්නා ලදී.



## 2008

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ 40 වන සංවත්සරයට සමගාමීව වඩාත් ඉඩකඩ සහිත ඉගෙනුම් කලාප ඇති කිරීම සඳහා පාලක සභාව විසින් ආයතනයේ යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම වෙනුවෙන් ආයෝජනය කරන ලදි.

## 2012

ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ උපාධි පිරිනැමීමේ පාසල වන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය ආරම්භ කරන ලදී.

# පාලක සභාව

**මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා**
සභාපති,
ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය
120/5, විජේරාම මාවත,
කොළඹ 07.

**මහාචාර්ය එල්. පී. ජයතිස්ස මහතා**
උද්භිද විද්‍යා අංශය,
විද්‍යා පීඨය,
රුහුණු විශ්වවිද්‍යාලය

**ආචාර්ය ඊ. ඒ. වීරසිංහ මහතා**
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය
120/5, විජේරාම මාවත,
කොළඹ 07.

**මහාචාර්ය උදිත ලියනගේ මහතා**
අධ්‍යක්ෂ,
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
28, ලෙස්ලි රණගල මාවත,
කොළඹ 08.

**ඩර්ක් පෙරේරා මහතා**
සභාපති
වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනය,
356,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**සුජීව රාජපක්ෂ මහතා**
සභාපති,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය,
30 ඒ, මළලසේකර මාවත,
කොළඹ 07.

**අයි. ජී. ජානක පාලිත මහතා**
ජ්‍යෙෂ්ඨ උප සභාපති,
ඩී. එෆ්. සී. සී. බැංකුව,
73/5, ගාලු පාර,
කොළඹ 03.

**කේ. ඒ. අයි. කුමාරපෙරුම මහතා**
නීතිඥ,
11, ඇලවත්ත පාර,
නුගේගොඩ.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ව්‍යාපාරික අධ්‍යාපන ආයතනය වන්නේ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයයි. අපි ගෝලීය ප්‍රවණතා සමඟ ඉදිරියට යමින් කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන ලෙස නිරතුරුවම අපගේ නිපැයුම් උත්ශ්‍රේණිගත කරන්නෙමු. පසුගිය කාලය මුළුල්ලේ කළමනාකරණය, පුහුණු කටයුතු හා අධ්‍යාපනය සම්බන්ධ ප්‍රමුඛ ආයතනය බවට පත් වෙමින් අපගේ අනන්‍යතාවය ගොඩනගාගෙන ඇත්තෙමු. අප ආයතනය දහස් ගණනකට වඩා යහපත් අනාගතයක් ගොඩනගා ගැනීමට උපකාරී වී ඇත.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහයෝගය ඇතිව අන්තර්ජාතික කම්කරු සංවිධානයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනයක් ලෙස ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය, 1968 දී කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද අතර දැනට වසර 44 ක් පුරා මෙමගින් සේවාවන් සපයා ඇත. පසුව එය පාර්ලිමේන්තු පනතක් මගින් (1976 අංක 23 දරණ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනත) ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ලෙස සංස්ථාපිත කරන ලදී.

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය රාජ්‍ය අංශයේ අධ්‍යාපන ආයතනයක් ද වේ. අප ආයතනය ස්ව ශක්තියෙන් මෙහෙයවෙන, ජාත්‍යන්තරව පිළිගත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් උපාධි පිරිනමන ආයතනයකි. එමෙන්ම අප ආයතනය 2009 වසරේ සිට ජාතික තත්ත්ව සම්මාන ප්‍රදානයේ දී ගෞරව සම්මානයෙන් පිදුම් ලද අතර ISO 9001:2008 තත්ත්ව සහතිකය ද හිමිකර ගැනීමට හැකි විය.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ පාලක සභාව විසින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනතේ විදිවිධාන මත පදනම්ව ව්‍යාපාර කළමනාකරණ ජාතික පාසල නමින් 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ වාණිජ ව්‍යවසායකත්වයක් ලියාපදිංචි කිරීමට තීරණය කර ඇත. මෙය ආරම්භ කරන ලද්දේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් ප්‍රකාශයට පත් කරන ලද 'මාර්ගෝපදේශයක් - රාජ්‍ය ව්‍යවසායකත්වයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය' මත පදනම්ව ය. මෙය ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයට පූර්ණ හිමිකම සහිත උප ආයතනයක් ලෙස කටයුතු කරනු ඇත.

# මානව සම්පත් කළමනාකරණය

ආයතනයේ අරමුණු ළඟා කර ගැනීමටත් ශිෂ්‍යයන්ට හා කාර්ය මණ්ඩලයට අගයන් ලබාදීමටත් ආයතනයේ කාර්ය මණ්ඩලය මනාව කළමනාකරණය කිරීම ඉතා වැදගත් බව ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හඳුනාගෙන ඇත. අපගේ සේවක පිරිස ආයතනික වගකීම් ඉටුකිරීමේලා පූර්ණ වශයෙන් නියැලී සිටින බව තහවුරු කිරීම සඳහා පහත සඳහන් සංඝටක අනුකලනය කෙරෙන ආකෘතියක් ගොඩනගා ඇත.

- බඳවා ගැනීම, තෝරා ගැනීම හා ස්ථාපනය
- උපාය මාර්ගික මෙහෙයුම (දීර්ඝකාලීන)
- කාර්ය සාධන ඉලක්ක (කෙටිකාලීන)
- කාර්යසාධන ඇගයීම
- පුහුණුව හා සංවර්ධනය
- ප්‍රතිලාභ කළමනාකරණය
- වෘත්තීය අභිවර්ධනය

මෙම සංඝටකයන් එකිනෙක අනුකලනය වී තම කාර්යය හා සංවිධානය කෙරෙහි ඉහළ මට්ටමේ සේවක කැපවීමක් ඇති කරන ආකාරය පහත දැක්වෙන ජාතික ව්‍යාපර කළමනාකාරීත්ව ආයතනයේ මානව සම්පත් කළමනාකරණ ආකෘතිය මගින් පැහැදිලි කෙරේ.




**ආකෘතිය - මානව සම්පත් කළමනාකරණ ආකෘතිය**

ආයතනයේ සේවකයින් කොටස් දෙකකට බෙදා දැක්විය හැක. එනම් දැනුම, නිපුණතා වර්ධනය හා උපදේශනය මගින් ඍජුවම අගයන් ඇති කිරීමේ ක්‍රියාවෙහි නියුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ආයතනය මනාව පවත්වාගෙන යාමට අවශ්‍ය සේවය සපයන අනධ්‍යයන කාර්ය මණ්ඩලයයි. මෙම කාණ්ඩ සඳහා වන කාර්යසාධන ඇගයීම හා එහි ප්‍රතිලාභ ලබාදීමේ සැලැස්ම එකිනෙකට වෙනස් ය. කෙසේ වුව ද මෙම කාණ්ඩ දෙක සඳහා කාර්යසාධන ඇගයීම හා ප්‍රතිලාභ ලබාදීම ජාතික ව්‍යාපර කළමනාකාරීත්ව ආයනයේ ඉලක්ක හා අරමුණු ළඟා කරගැනීම හා සම්බන්ධ වේ.

ඉහත ආකෘතියෙහි දැක්වෙන පරිදි අප සේවකයන්ට සංවිධානයේ අවශ්‍යතා මත පදනම් කරගත් රැකියා විශ්ලේෂණය තුළින් බිහි වූ රැකියා විස්තර හිමි වේ. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ දීර්ඝකාලීන හා මධ්‍යකාලීන සැලසුම්වල කොටසක් මත දැක්ම, මෙහෙවර හා අරමුණු මගින් සේවකයන් උපායමාර්ගිකව මෙහෙයවනු ලැබේ. අරමුණුවලින් සැදුම්ලත් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමත් වාර්ෂික අයවැයෙහි ඉලක්ක ළඟා කරගැනීමත් එක් එක් සේවකයා සතු වගකීම වේ.

සේවකයන්ගේ වගකීම් හා සම්බන්ධ කාර්යසාධනය මැන බැලීම කාර්යසාධන ඇගයීම් පත්‍රයක් මගින් වාර්ෂිකව සිදු කරනු ලබයි. උපදේශකවරු හා අධ්‍යක්ෂකවරු සම්බන්ධ කාර්යසාධන ඇගයීම් පත්‍රවල අන්තර්ගතය හා විශ්ලේෂණයෙහි ගැඹුර සෙසු කාර්ය මණ්ඩලය හා සසඳන විට මඳ වශයෙන් වෙනස් වන්නේ වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබා ගැනීමත් අවබෝධයත් සඳහා ය. සේවකයකුගේ කාර්යසාධනය, රැකියා විස්තරය හා වාර්ෂික අයවැයෙහි දැක්වෙන අපේක්ෂා සපුරාලන විට දිරිදීමනා, උසස්වීම්, වැටුප් වර්ධක හා කාර්යය ප්‍රසාරණය ආදිය මගින් ප්‍රතිලාභ ලබාදෙනු ලැබේ.

කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු වූ විට තම රැකියාව සඳහා අවශ්‍ය වන කුසලතා හා නිපුණතා වැඩිදියුණු කරගැනීම සඳහා සේවකයා හට පුහුණු හා සංවර්ධන අවස්ථා සලසා දෙනු ලැබේ. සේවකයාගේ ආකල්ප හා හැසිරීම නිවැරදි කිරීම සඳහා ද පුහුණුව හා සංවර්ධනය ඉවහල් වේ.

වැඩි වශයෙන් සුදුසුකම් හා නිපුණතා ලබා ගැනීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය විසින් මෙහෙයවනු ලබන වැඩසටහන් මෙන් ම බාහිර වැඩසටහන් සඳහා ද සහභාගි වීමට අපගේ සේවකයන් දිරිමත් කෙරේ. සේවකයකු ඉහළ සුදුසුකම් ලබා ගත් විට ඔහුට/ඇයට වඩා ඉහළ තනතුරක් සඳහා අයදුම් කිරීමට හැකියාව ලැබේ.

පහත දැක්වෙන භෞතික ප්‍රතිලාභ හා නිවැරදිව ලබාදෙන සහයෝගය මගින් සේවක තෘප්තිය ඉහළ නැංවීමට අපි උත්සාහ දරන්නෙමු.

- මූල්‍ය ප්‍රතිලාභඃ දිරිදීමනා, වැටුප් වර්ධක, වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන වියදම් ප්‍රතිපූර්ණය කිරීම.
- මූල්‍ය නොවන ප්‍රතිපාදනඃ උසස්වීම්, විදේශ පුහුණු වැඩසටහනන්
- වැඩ පරිසරය/පහසුකම් වැඩිදියුණු කිරීම.
- වෘත්තිය අභිවර්ධනය හා වර්ධනය සඳහා අවස්ථා.
- සේවා ප්‍රසාරණය හා සඵලකරණය.
- අධීක්ෂකයන්, සමාන මට්ටමේ පුද්ගලයන් හා යටත් නිලධාරීන්ගේ සහාය.

අපගේ සේවක තෘප්තිමත්භාවය මැනීම තුළින් සේවකයා අදාළ ක්ෂේත්‍රවල ලබා ඇති ප්‍රගතිය කවර මට්ටමක පවතී ද යන්න පෙන්නුම් කරයි. එම ප්‍රගතිය පහළ මට්ටමක පවතින ක්ෂේත්‍ර ඇතොත් ඒවා දියුණු කිරීම සඳහා පවතින අවස්ථා හඳුනාගත හැකි වේ.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සමස්ථ සේවක පිරිස, දීර්ඝකාලීන වශයෙන් ශිෂ්‍යයන්/සේවාදායකයන් හා සංවිධාන ලබන තෘප්තිය වැඩිදියුණු කිරීම හා කෙටිකාලීන වශයෙන් අයවැයෙහි දැක්වෙන ආදායම ලබාගැනීම යන පොදු අරමුණු සඳහා සේවය කරති. ඉහළ මට්ටමේ මූල්‍ය සාධනයන් ළඟා කර ගැනීම තුළින් ඔවුනට වඩා හොඳ ප්‍රතිලාභ ලබාගත හැක. මෙය ඉටු කර ගත හැක්කේ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ කම්කරුවන්ගේ සිට උපදේශකයන් දක්වා සියලුම සේවක ස්ථරයන්ගේ සාමූහික ප්‍රයත්නය හා සහයෝගීතාවය තුළින් ය. අපගේ සේවා පද්ධතිය අනුව සෑම සේවකයකුටම අනන්‍ය වූ කාර්යභාරයක් තිබෙන අතර එය ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ඵලදායීතාවයට දායක

වේ. ආයතනයේ විවිධ ස්ථරයන් අතර සන්නිවේදනය ලියවිලි, චක්‍රලේඛ, දැන්වීම්, රැස්වීම් වාචික උපදෙස් හා ප්‍රතිචාර, දුරකථන ඇමතුම් හා විද්‍යුත් තැපැල මගින් ඉටුවේ. මහනුවර, ගාල්ල හා කුරුණෑගල මධ්‍යස්ථාන සමඟ සන්නිවේදනය ද එම ක්‍රමවේද සුදුසු අයුරින් යොදා ගනිමින් සිදු කෙරේ.

## මානව සම්පත් සංවර්ධනය

සංවර්ධනය යනු ඉදිරියට යාමට හැකිවන අයුරින් සේවක මණ්ඩලයේ වගකීම් බෙදාදීම සහ ඒ මොහොතේ දී ම ඉගෙනුම් හා සංවර්ධන අවස්ථා ලබාදීම සිදු කිරීමයි. සේවකයින්ගේ සම්පූර්ණ රැකියා භූමිකා හා වැඩ ක්‍රියාවලිය තුළ සේවක දායකත්වය වර්ධනය කිරීම සඳහා නව පුහුණු හා සංවර්ධන වැඩසටහන්වලට පෙළඹවීම සිදු කෙරේ. කාර්යය මණ්ඩලයේ වෘත්තීය දක්ෂතාව වර්ධනය කිරීමට ආයතනය කටයුතු කරයි. ආයතනය විසින් සේවක නිපුණතා විශ්ලේෂණය හා සේවක විශ්වාසනීයභාවය ඉදිරියට ගෙනයෑම සඳහා පහත සඳහන් ශිල්පක්‍රම භාවිතා කිරීම තුළින් සේවක ඵලදායීතාවය හා රැකියා තෘප්තිය වැඩිකිරීම සිදුවේ.

- කාර්ය මාරුව
- සේවකයන් අලුතෙන් ස්ථාපනය කිරීම.
- කාර්යය ප්‍රසාරණය
- රැකියාවේ වර්ධනය

ප්‍රධාන සේවක සංගම් දෙකක් පිහිටුවාගෙන ඇති අතර ඒවා පිහිටුවාගෙන ඇත්තේ ආයතනයේ ප්‍රධාන කාර්යයන් හා ජීවගුණය පවත්වාගෙන යාමට අන්‍යෝන්‍ය වශයෙන් බලපාන බැවිනි. එම සංගම් දෙක පහත පරිදි වේ:

- ක්‍රීඩා හා සුභසාධක සංගමය
- අවමංගල්‍යාධාර සංගමය

## මානව සම්පත් පුහුණු කිරීම

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන් සඳහා යොමුකර තිබේ. එම වැඩසටහන් පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

## අභ්‍යන්තර පුහුණු වැඩසටහන්වලට සහභාගිවීම

| | නම | පාඨමාලාවේ නම |
|---|---|---|
| 01 | එල්.එම්. වික්‍රමසිංහ මහතා | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව |
| 02 | නිමාලි අබේසිංහ මෙනවිය | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව |
| 03 | නිෂානි පෙරේරා මෙනවිය | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව |
| 04 | ඩබ්.ඒ.එස්.සී. විජේසිංහ මෙනවිය | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව |
| 05 | බී.ඒ.සී.ඩී. ජයසිංහ මෙනවිය | වෘත්තිකයන් සඳහා වන ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව |
| 06 | එච්.එන්. ඉන්දික මහතා | පරිගණක මූලික යෙදවුම් පැකේජ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව |
| 07 | ජී.ඒ. ලක්ෂ්මන් මහතා | වෘත්තිකයන් සඳහා වන කථන ඉංග්‍රීසි පාඨමාලාව |
| 08 | සීතා විජේසිංහ මිය | වෘත්තිකයන් සඳහා වන කථන ඉංග්‍රීසි පාඨමාලාව |
| 09 | නයනා විතානච්චි මිය | වෘත්තිකයන් සඳහා වන කථන ඉංග්‍රීසි පාඨමාලාව |
| 10 | සියලුම වැසටහන් නිලධාරි කාර්ය මණ්ඩලය | (Calls Managements) පිළිබඳ පුහුණු වැඩසටහන |

## දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වීම

| | නම | පාඨමාලාවේ නම |
|---|---|---|
| 01 | නිල්මිණි ධර්මවර්ධන මිය | අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් පිළිබඳ සම්මන්ත්‍රණය |
| 02 | බර්නාඩ් සිල්වා මහතා | අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් පිළිබඳ සම්මන්ත්‍රණය |
| 03 | සිවාන්ජලී යෝගරාජා මිය | අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් පිළිබඳ සම්මන්ත්‍රණය |
| 04 | ආර්. ජී. මන්චනායක මහතා | තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික සමුළුව |
| 05 | ඩී. එස්. එස්. ජයසිංහ මහතා | Two Days Training Programme on Basic Lighting Desing & Energy Efficient Lighting |
| 06 | ටී. එස්. පී. වීරසිංහ මහතා | IPICT Facilitators Training Programme |
| 07 | නිල්මිණි ධර්මවර්ධන මිය | අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් භාවිතයේ දී ඇතිවන බදු සම්බන්ධ ගැටලු |
| 08 | සුනිල් හේරත් මහතා | ව්‍යාපාරික ස්ථානවල බලශක්ති සංරක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය |
| 09 | කෝලිත රණවක මහතා | 25th Annual Sessions of the OPA |
| 10 | ආචාර්ය ඊ. ඒ. වීරසිංහ මහතා | 25th Annual Sessions of the |
| 11 | ඩී. එම්. ඒ. කුලසූරිය මහතා | 25th Annual Sessions of the OPA |
| 12 | ජී. ඩී. බර්නාඩ් සිල්වා මහතා | Seminal on SLFRS & LKAS |
| 13 | එන්. කේ. ධර්මවර්ධන මිය | වරලත් ගණකාධිකාරී ආයතනයේ ජාතික සමුළුව 2012 |
| 14 | එස්. අමිලන් මිය | වරලත් ගණකාධිකාරී ආයතනයේ ජාතික සමුළුව 2012 |
| 15 | එන්. කේ. ධර්මවර්ධන මිය | අයවැය සම්මන්ත්‍රණය |
| 16 | කේ. විජේසිරිවර්ධන මිය | Workshop on "Mobile Application development & testing best practices" |
| 17 | ආර්. ජී. මංචනායක මහතා | Workshop on "Mobile Application development & testing best practices" |
| 18 | ඩී. එන්. චම්පිකා මහන්තගේ මිය | 2012 NILLS සම්මන්ත්‍රණය |

## වැඩ සටහන් සඳහා සහභාගි වූ සේවක සංඛ්‍යාව

| | 2011 | 2012 |
|---|---|---|
| අභ්‍යන්තර පුහුණු වැඩසටහන් | 12 | 10 |
| දේශීය පුහුණු වැඩසටහන් | 25 | 18 |
| විදේශීය පුහුණු වැඩසටහන් | 01 | 0 |
| එකතුව | 38 | 28 |

වගුව 01 - පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ සේවක සංඛ්‍යාව




රූප සටහන 01- පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ පුහුණුවන්නන් ගණන

## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ මානව සම්පත්

| | අනුමත සේවක සංඛ්‍යාව **2012.12.31** | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| **අධ්‍යයන කාර්ය මණ්ඩලය** | 50 | 26 | 29 | 31 | 48 | 36 |
| **විධායක කාර්ය මණ්ඩලය** | 53 | 22 | 25 | 20 | 19 | 18 |
| **සහකාර කාර්ය මණ්ඩලය** | 119 | 75 | 84 | 100 | 93 | 97 |
| **එකතුව** | **222** | **123** | **138** | **151** | **153** | **151** |




රූප සටහන 02 ආයතනයේ මානව සම්පත් සංයුතිය

## 2012 තුළ ආයතනයේ බඳවාගැනීම්

| | නම | තනතුර | බඳවාගැනීමේ දිනය |
|---|---|---|---|
| 1 | පී.පී.කේ. පියරත්න මෙය | කම්කරු | 02.01.2012 |
| 2 | බී.ඒ.සී.ඩී. ජයසිංහ මහතා | කළමනාකරණ සහකාර | 02.01.2012 |
| 3 | කේ.ඒ.පී. කුමාර මහතා | කම්කරු | 13.03.2012 |
| 4 | එච්.කේ.සී. තිලංක මහතා | කළමනාකරණ සහකාර | 16.04.2012 |
| 5 | එස්.එල්.ඒ.එන්. උදයංගනී මෙය | කළමනාකරණ සහකාර | 16.04.2012 |
| 6 | ආර්.ඩී.එන්. විජන්ති මෙය | උපදේශක/දේශක | 02.07.2012 |
| 7 | යූ.පී.ඩී.ටී. විමලරත්න මෙය | උපදේශක/දේශක | 09.07.2012 |
| 8 | කේ.ඒ.ඩී. චලනි මෙය | උපදේශක/දේශක | 13.08.2012 |
| 9 | රිහාම් මයා | උපදේශක/දේශක | 13.08.2012 |

## 2012 වසර තුළ ඉල්ලා අස්වීම්

| | නම | තනතුර | බැඳවාගැනීමේ දිනය |
|---|---|---|---|
| 1 | එල්. සමරවීර මෙය | උපදේශක/දේශක | 29.02.2012 |
| 2 | වයි.ඩී.සී. ද සිල්වා මෙය | කළමනාකරණ සහකාර | 01.03.2012 |
| 3 | සී.එස්. රණවීර මෙය | කළමනාකරණ සහකාර | 01.03.2012 |
| 4 | ටි.පී.ආර්. කයිලාශනී මෙය | උපදේශක/දේශක | 16.03.2012 |
| 5 | ඒ.කේ.පී. ජයලත් මෙය | කළමනාකරණ සහකාර | 20.09.2012 |
| 6 | දේවිකා වීරවර්ධන මෙය | වැඩසටහන් සම්බන්ධීකාරක | 01.11.2012 |
| 7 | නදී ගුණතිලක මෙය | කළමනාකරණ සහකාර | 01.11.2012 |
| 8 | සී.සී.බී. විජේසිංහ මහතා | උපදේශක/දේශක | 01.11.2012 |
| 9 | චමින්ද රත්නායක මහතා | උපදේශක/දේශක | 01.11.2012 |

## මෙහෙයුම් ආදායම හා ලාභය කෙරෙහි සේවකයින්ගේ දායකත්වය

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| මෙහෙයුම් ආදායම | 193,014 | 261,350 | 357,779 | 551,155 | 726,561 | 957,073 |
| ශුද්ධ ලාභය | 46,258 | 80,607 | 90,084 | 111,752 | 293,054 | 421,209 |
| කාර්ය මණ්ඩලය | 117 | 123 | 138 | 151 | 153 | 177 |
| මෙහෙයුම් ආදායම - ඒක පුද්ගල | 1,650 | 2,125 | 2,593 | 3,650 | 4,748 | 5,407 |
| ශුද්ධ ලාභය - ඒකපුද්ගල | 395 | 655 | 652 | 740 | 1,915 | 2,380 |




රූපසටහන - 03 මෙහෙයුම් ආදායම කෙරෙහි සේවකයන්ගේ දායකත්වය

## තරගකාරී වෙළෙඳපොළට මුහුණදීම සඳහා යොදාගන්නා ලද ක්‍රමවේදයන්

වත්මන් දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා සුදුසු හැකියාවන් හා නිපුණතාවයන්ගෙන් සපිරි වෘත්තිකයන්, උපාධිධාරීන් හා ඩිප්ලෝමා ලාභීන්ට තම සුදුසුකම් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයෙන් ලබාගැනීම සඳහා නූතන අවශ්‍යතා අනුව ක්‍රමානුකූලව හා සංවිධානාත්මක ආකාරයෙන් පාඨමාලා පවත්වනු ලැබේ. මෙම අරමුණු සපුරාගැනීම සඳහා 2012 වසරේ දී යොදාගන්නා ලද ක්‍රමවේදයන් පහත පරිදි ය.

- සියලුම සේවාවන් සඳහා ආයතනය සෙනසුරාදා ඉරිදා හා රජයේ නිවාඩු දිනවල (පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා) විවෘතව පවතී.
- ආයතනයේ වෙබ් අඩවිය තුළින් ඉදිරි අපේක්ෂකයන්ට අදාළ තොරතුරු ලබාගැනීම හා ලියාපදිංචි වීම කළ හැකි ය. වෙබ් අඩවිය www.nibm.lk.
- පාඨමාලා ගාස්තු චෙක්පත්, ණයවරපත් හා මුදලින් ගෙවීම සඳහා පහසුකම් සපයා ඇත.
- අධ්‍යයන වර්ෂය ආරම්භ වීමට පෙර පාඨමාලා සකස් කර ඇති බැවින් කලින්ම තම කාර්ය මණ්ඩලයට ගැළපෙන පුහුණු පාඨමාලාව තෝරාගැනීමට පුද්ගලික හා රාජ්‍ය අංශයන්ට හැකියාව ඇත.
- වැඩ මුළුවේ කාලය දින හතකට වඩා අඩු නම් වැඩමුළුව සම්පූර්ණ කරන දිනයේ දී ම සහතික පත් නිකුත් කරනු ලැබේ.
- අනෙකුත් පාඨමාලාවලට අදාළ සහතික පත් පාඨමාලා සම්පූර්ණ කරන දිනයේ සිට මසක් ඇතුළත නිකුත් කරනු ලැබේ.
- ප්‍රදර්ශන, වැඩමුළු, මාධ්‍ය නිවේදන හා රූපවාහිනී දැන්වීම් වැනි ආකර්ශණීය ක්‍රමවලින් ආයතනයේ සේවාවන් පිළිබඳව ජනතාව දැනුවත් කෙරේ.
- පෙර කොළඹ දී පමණක් පැවැත්වූ පාඨමාලා දැන් නුවර, කුරුණෑගල හා ගාල්ල යන ප්‍රදේශවල ද පැවැත් වේ.
- උපදේශන, ඵලදායිතාවය හා කළමනාකරණ සංවර්ධන සේවාවන් රාජ්‍ය හා පුද්ගලික අංශයන්ගේ අවශ්‍යතාවන් අනුව සකසා ගත හැකි ය.
-
- ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය හා උපාධි ප්‍රදානෝත්සවය වාර්ෂිකව උත්සවාකාරයෙන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වේ.

## වෛද්‍ය රක්ෂණය

කාර්යය මණ්ඩලයේ සුබසාධනය හා යහපත් සෞඛ්‍යය වෙනුවෙන් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂිකව නැවත අලුත් කළහැකි වෛද්‍ය රක්ෂණාවරණයක් ලබාගෙන ඇත. මෙම රක්ෂණාවරණය යටතේ ආයතනයේ සේවකයන්ගේ රෝහල්ගතවීමේ බිල්පත්වලට අමතරව සාමාන්‍ය වෛද්‍ය බිල්පත් හා රෝහල් බිල්පත්වලට අදාළ මුදල් ප්‍රතිපූරණය කරනු ලැබේ. මෙය, එහි සේවකයන් වෙනුවෙන් ආයතනය මගින් සිදුකරනු ලබන ඉතා වැදගත් සේවාවකි.

# ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ උපාධි විද්‍යායතනය

## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය - NSBM

ශ්‍රී ලංකාවේ පළමුවන හරිත විශ්වවිද්‍යාලය වන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය සඳහා මුල්ගල තැබීමේ උත්සවයත් සමග ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය අධ්‍යාපනයේ නව යුගයකට පිවිසෙයි. (2012 ජුලි 25)















ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනතේ විධිවිධාන මත පදනම්ව එහි පාලක සභාව විසින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (NSBM) නමින් වන ව්‍යාපාර පාසලක්, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ වාණිජ ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමට තීරණය කරන ලදී. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 'රාජ්‍ය ව්‍යවසායකත්වයන්හි සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ මාර්ගෝපදේශය' මත පදනම්ව මෙය ආරම්භ කරන ලදී. NSBM, ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ පූර්ණ හිමිකම් සහිත අනුබද්ධ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වනු ඇත.

මෙම ව්‍යාපාර විද්‍යායතනය හෝමාගම පිටිපන ප්‍රදේශයේ ඉදිකරනු ලැබෙන අතර එය පළමුව ශිෂ්‍යයන් 5000ක් සඳහා ද ඉන් පසු ක්‍රමයෙන් ශිෂ්‍යයන් 25,000 ක් සඳහා ද පහසුකම් සහිතව පිහිටවනු ඇත. අංග සම්පූර්ණ දේශන ශාලා හා ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් පහසුකම් සමගින් මෙම පාසල දකුණු ආසියාවේ හොඳම විශ්වවිද්‍යාල අතරින් එකක් වනු නො අනුමාන ය.

## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයෙහි ක්‍රියාකාරීත්වය

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ උපාධි පිරිනැමීමේ ආයතනය වන සී/ස ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික විද්‍යායතනය 2012 මාර්තු 12 දින කැබිනට් අනුමැතිය මත 2012 මාර්තු මස දී ආරම්භ කරනු ලැබිණි. ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික විද්‍යායතනය ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ පූර්ණ හිමිකම් සහිත අනුබද්ධ ආයතනයක් වන අතර කළමනාකරණය, පරිගණක හා ඉංජිනේරු විෂයයන්ට අදාළ උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලාවන් පිරිනමනු ලබයි. ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික විද්‍යායතනය 2012 මාර්තු මස කොළඹ හයිලෙවල් පාරේ පිහිටි ඉඩ පහසුකම් සහිත සයමහල් ගොඩනැගිල්ලක සිය පුර සරසවියේ (City Campus) වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

2015 අගභාගය වන විට ශ්‍රී ලංකා රජය විසින් දැනුම් පුරවරය ලෙස හඳුන්වන ලබන හෝමාගම පිටිපන ප්‍රදේශයේ අක්කර 26 ක පරිසර හිතකාමී හා වඩා ඉඩපහසුකම් සහිත භූමියක ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය සිය වැඩ කටයුතු සම්පූර්ණ වශයෙන් ආරම්භ කරනු ඇත. එහි උසස් අධ්‍යාපනය සඳහා වන නවීන පහසුකම්, නේවාසිකාගාර සහ ක්‍රීඩා පහසුකම් සහිතව ශිෂ්‍යයන් 25,000 ක් සඳහා ඉඩකඩ සැලසෙනු ඇත.

කලාපයේ වැඩිම ආකර්ෂණය සහිත ව්‍යාපාර පාසල වීමේ දැක්මක් සහිත මෙය නායකත්වය, සදාචාරය, විශ්වීය චින්තනය, හරයාත්මක කළමනාකරණ හැකියාවන් හා නව තාක්ෂණික නවෝත්පාදනයන් සමඟ අනුකලනය වුණු ලොව පිළිගත් උපාධි පාඨමාලාවන් රැසකින් සමන්විත වෙයි. කළමනාකරණ, පරිගණක යන ක්ෂේත්‍රයන්ගේ උපාධිධාරී හා පශ්චාත් උපාධිධාරී වෘත්තිකයන් බිහිකිරීම එහි ප්‍රධාන අරමුණ වේ.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයෙහි මෙහෙවර ප්‍රකාශනයෙන් දැක්වෙන පරිදි එය අනාගත පරම්පරාවන්ගේ නිර්මාණාත්මක හා නවෝත්පාදක පාසලයි. දැනුම පදනම්ව ගෝලීයකරණය වූ ආර්ථිකය වෙත අප රට රැගෙන යමින් හා 21 වන සියවස තුළ දී කළමනාකරණ, පරිගණක හා ඉංජිනේරු ක්ෂේත්‍රයන් තුළ වන අවශ්‍යතාවන් පිළිබඳව සලකා බලමින් පවතින දැනුම් සම්භාරයන් එක්තැන් කිරීමේ අරමුණ ඇතිව ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය ව්‍යවසායකත්වය, තාක්ෂණය හා ගෝලීයකරණය යන තේමාවන් යටතේ ක්‍රියාත්මක වනු ඇත.

## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයේ දැක්ම

අනාගත නායකයන් බිහිකිරීමේ ප්‍රමුඛතම ව්‍යාපාරික විද්‍යායතනය බවට පත්වීම.

## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයේ මෙහෙවර.

අධ්‍යාපනය, අධ්‍යයනය හා පර්යේෂණ තුළින් සමෘද්ධිමත් සමාජයක් ගොඩනැගීමට දායක වීම.

**අගයන්,**

- ජීවිත වෙනසකට ලක්කිරීම සඳහා කටයුතු කිරීම
- ශාස්ත්‍රීය සුවිශිෂ්ටත්වය කරා ළඟාවීම.
- පර්යේෂණ සඳහා පෙලඹවීම.
- ගෝලීය ජාලකරණය
- ඒකාග්‍රතාවය හා වගවීම.
- නවෝත්පාදනය හා වෙනස්කම් සඳහා මඟ සැලසීම

## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයේ සංයුතිය

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ උපාධි පිරිනමන විද්‍යායතනය වන ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනය, ව්‍යාපාර විද්‍යායතන, පරිගණක විද්‍යායතනය හා ඉංජිනේරු විද්‍යායතනය ලෙස වන විද්‍යායතන තුනකින් සමන්විත වෙයි. ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනය මගින් සෑම වසරකටම දෙවරක් ශිෂ්‍යයන් 1500 කට ආසන්න ප්‍රමාණයක් බඳවා ගනු ලබන අතර එය ජාතික විශ්වවිද්‍යාල සඳහා බඳවා ගන්නා ප්‍රමාණයෙන් 6%ක් පමණ වෙයි.

.

## ව්‍යාපාර විද්‍යායතනය

ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනයේ, ව්‍යාපාර විද්‍යායතනය මගින් එහි සිසුන්ට අධ්‍යයනය සඳහා සුවශේෂී එළඹුමක් ලබාදෙයි. ඉගැන්වීම, ඉගැනීම, පර්යේෂණ හා ව්‍යාපාරික ප්‍රජාව සමඟ ජාලගත වීම යනාදී සෑම අංශයක් තුළම විශිෂ්ටත්වය සඳහා අවශ්‍ය වන සෑම පියවරයක්ම ගෙන ඇත.

ව්‍යාපාර කළමනාකරණය, කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, නීතිය, ගණකාධිකරණය සහ එවැනි විවිධ ක්ෂේත්‍රයන්ගේ උපාධි පාඨමාලාවන් ව්‍යාපාර විද්‍යායතනය මගින් පිරිනමනු ලබයි. අයර්ලන්තයේ ඩබ්ලින් විශ්වවිද්‍යාලය කොලිජිය, මලයාසියාවේ නිර්මාණාත්මක තාක්ෂණය පිළිබඳ ලිම්කොක්වින්ග් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානියේ ප්ලයිමවුත් විශ්වවිද්‍යාලය වැනි කීර්තිමත් විශ්වවිද්‍යාල සමඟ අනුබද්ධ වීම මගින් මෙරටේ දී ම හා පිටරටදීත් ලොව පිළිගත් සුදුසුකම් ලබාගැනීමට එහි සිසුන් හට අවස්ථාව උදා වේ.

ව්‍යාපාර විද්‍යායතනය තුළ ඉගෙනීම සුවිශේෂී අත්දැකීමකි. පංති කාමරය තුළ ලබාගන්නා අධ්‍යාපනය සත්‍ය ලෝකයේ තත්ත්වයන් හා මුහුකිරීමටත් තම ශාස්ත්‍රීය දැනුම සජීවී ව්‍යාපාරික අභියෝගයන් වෙත අදාළ කරගැනීමටත් සිසුනට අවස්ථාව ලබා දී ඇත.

## පරිගණක විද්‍යායතනය

පරිගණක විද්‍යායතනය අයර්ලන්තයේ ඩබ්ලින් විශ්වවිද්‍යාල කොලිජිය, මලයාසියාවේ ලිම්කොක්වින්ග් නිර්මාණාත්මක තාක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානියේ ප්ලයිමවුත් විශ්වවිද්‍යාලය යනාදී ඉහළ පෙළේ විශ්වවිද්‍යාල සමඟ සමීප සබඳතා පවත්වයි. එමගින් එම සිසුන්හට උපාධි පාඨමාලාවන් ගණනාවක් හැදෑරීමේ අවස්ථාව ලැබී ඇත.

උපාධි හා පශ්චාත් උපාධි මට්ටම්වලින් නවීනතම හා දියුණුතම පරිගණක විද්‍යා පිරිවිතරයන්ගෙන් සමන්විත විවිධත්වයෙන් යුතු අධ්‍යයන පාඨමාලා මෙයින් පිරිනමනු ලබයි.

## ඉංජිනේරු විද්‍යායතනය

ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනයේ ප්‍රධාන විද්‍යායතන අතරින් එකකි ඉංජිනේරු විද්‍යායතනය. මෙම විද්‍යායතනය මගින් ලොව කීර්තිමත් විශ්වවිද්‍යාල හා අනුබද්ධව පරිගණක ඉංජිනේරු හා ඉලෙක්ට්‍රොනික උපාධි පාඨමාලාවන් පිරිනමනු ලබයි. පර්යේෂණ හා සංවර්ධන කටයුතු, කාර්ය මණ්ඩල පුහුණුව හා ජාත්‍යන්තර ප්‍රජාවන් හා ජාලගතවීම තුළන් නවීන තාක්ෂණය සමඟ මුසුවීමට මෙම විද්‍යායතනයට හැකියාව ලැබී ඇත.

## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයට අනුබද්ධ විශ්වවිද්‍යාල

ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනය ලොව ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාල තුනක් සමඟ විශේෂිත වූ හවුල් එකඟතාවන්ට එළඹ ඇත. අධ්‍යාපනය ලබාදීම හා සහතික ලබාදීමට අදාළව හවුල්කාරීත්ව සංවර්ධනය වෙත ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනයේ එළැඹීම සුවිශේෂ වෙයි. විදේශ

විශ්වවිද්‍යාල සමඟ ව්‍යාපාර ඇතිකරගන්නා කළමනාකරණය පිළිබඳ විද්‍යායතනය හවුල්කාරිත්වයේ පදනම වන්නේ ඒවායේ ලොව පිළිගත් මට්ටමයි. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වෙනත් විදේශ විශ්වවිද්‍යාල හා සන්සන්දනය කරන විට මෙහි ඇති විශේෂත්වය වන්නේ ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනයේ අධ්‍යයන පාඨමාලා දේශනවලින් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් හවුල්කාර විශ්වවිද්‍යාලවල මහාචාර්යවරුන් විසින් සිදු කිරීමයි. පශ්චාත් උපාධි පාඨමාලාවන්හි දී එම හවුල්කාර විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයන් විසින් පාඨමාලා දේශනවලින් 90% ක් පමණ සිදු කරනු ලබයි. දේශීය දැනුම ගෝලීය අත්දැකීම්වලින් පරිපූර්ණ කිරීම සහතික කරනු පිණිස මෙම පාඨමාලාවන්හි පර්යේෂණ අධ්‍යයන පමණක් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලැබේ.

## ඩබ්ලින් යුනිවසිටි කොලිජිය - අයර්ලන්තය

උපාධි අපේක්ෂක අධ්‍යාපනය, පශ්චාත් උපාධි, ආචාර්ය උපාධි, පුහුණු, පර්යේෂණ. ප්‍රජා සහභාගිත්වය යනාදී අඛණ්ඩ ක්‍රියාවලින්ගෙන් සැදුම්ලත් පර්යේෂණ මත පදනම් වූ යුරෝපයේ ප්‍රධානතම විශ්වවිද්‍යාලයකි අයර්ලන්තයේ ඩබ්ලින් යුනිවසිටි කොලිජිය. මෙම විශ්වවිද්‍යාලය 1854 දී ජෝන් හෙන්රි නිව්මන් විසින් පිහිටුවන ලද අතර අද වන විට මෙම විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන් 25,000 ක් පමණ සිටින අයර්ලන්තයේ විශාලතම විශ්වවිද්‍යාලය වෙයි. අයිරිෂ් ශිෂ්‍යයන් අතර ප්‍රචලිතම විශ්වවිද්‍යාලය මෙය වන අතර මෙහිදී උසස් නවෝත්පාදක හා නව්‍යශීලී උපාධි අපේක්ෂක විෂය ධාරාවන් හරහා සරසවි අධ්‍යාපනයේ නිම් වළලු පුළුල් කරමින් ශාස්ත්‍රිය සහ පුද්ගල අනාවරණයන් වෙත යොමු වූ මාවතක් ලෙස විශ්ව විද්‍යාලීය ජීවිතය ප්‍රවර්ධනය කෙරේ. අයර්ලන්තයේ ශිෂ්‍යයන් 28% ක් මින් නියෝජනය වන අතර ආචාර්ය උපාධිය හදාරන සිසුන් 2000 ක් පමණ මෙහි වේ. ඩබ්ලින් යුනිවසිටි කොලිජියේ උපාධි අපේක්ෂකයන් 50% ක් පමණ පශ්චාත් උපාධි සඳහා ප්‍රවේශ වෙයි.

ඩබ්ලින් යුනිවසිටි කොලිජියේ ජාත්‍යන්තර සිසුන් 5000ක පමණ ප්‍රමාණයක් ඇති අතර අයර්ලන්ත ජාතික ශිෂ්‍යයන් ජාත්‍යන්තරකරණය කිරීම සඳහා වැඩි උත්සාහයක් දරයි. සියලුම ශිෂ්‍යයන් දේශසීමා මායිම් හා සංස්කෘතික මායිම් ඉක්මවා වඩා දියුණු ජීවිතයකට හා අනාගත රැකියාවන්ට යොමු කිරීමට මෙම විශ්වවිද්‍යාලය සමත් වී ඇත.

## ලිම්කොක්වින්ග් නිර්මාණාත්මක තාක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාලය - මලයාසියාව

ලිම්කොක්වින්ග් නිර්මාණාත්මක තාක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාලය, මහද්වීප තුනක් පුරා පැතිරුණු ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් වන අතර රටවල් 150 ක විශ්විද්‍යාල අංශ 12 ක් තුළ ශිෂ්‍යයන් 30,000 ක් පමණ ඉගෙනුම ලබයි. 1991 එහි ආරම්භයේ සිටම ලිම්කොක්වින්ග් විශ්වවිද්‍යාලය වෙළෙඳපොළ ඉල්ලුම්වලට සංවේදී වූ අතර පංති කාමරයේ සිට වැඩබිම් දක්වා සියුම් ලෙස වෙනස් විය හැකි උපාධිධාරීන් බිහිකිරීම තම වගකීමක් ලෙස සලකයි.

## ජ්ලයිමවුත් විශ්වවිද්‍යාලය - එක්සත් රාජධානිය

ජ්ලයිමවුත් විශ්වවිද්‍යාලය 1862 ආරම්භ වූ අතර එක්සත් රාජධානියේ ඇති ප්‍රධානතම විශ්වවිද්‍යාලවලින් එකකි. නවීන විශ්වවිද්‍යාල අතර තුන්වන ස්ථානයේ නිරන්තරව රැඳෙන ජ්ලයිමවුත් විශ්වවිද්‍යාලය සතුව ශිෂ්‍යයන් 30,000 ක් ද 3000 ක කාර්ය මණ්ඩලයක් ද ඇති අතර ස්ටර්ලින් පවුම් මිලියන 160 ක වාර්ෂික ආදායමක් ලබයි.

1996 සිට බාහිර ආයතනයක් මගින් කරන ලද සියලු ඉගැන්වීම් සමාලෝචනයන්හි දී ජ්ලයිමවුත් විශ්වවිද්‍යාලය තම කාර්යයන් මැනවින් දක්වා ඇත. RAE හි ජයග්‍රහණයන් මගින් ප්‍රදර්ශනය කර ඇති පරිදි විශ්වවිද්‍යාලයට ඉහළ ගුණත්වයකින් යුතු නවෝත්පාදක පර්යේෂණයන් පිළිබඳ දිගු ඉතිහාසයක් තිබේ.

## ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනයේ නිෂ්පාදන හා සේවාවන්

ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනය. ගෝලීයකරණය හා තාක්ෂණයේ ප්‍රවණතාවයන් හඳුනා ගනිමින්, තරුණ තරුණියන් නව ලොව අභියෝගයන් සඳහා සූදානම් කරනු පිණිස නව්‍යාත්මක හා විකල්ප වූ නව ප්‍රවේශයන් සැලසුම් කර ඇත. එමගින් ක්ෂේත්‍ර නිශ්චිත හා සම්ප්‍රදායික නොවූ උපාධි වැඩසටහන් හැදෑරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව පැදි ඇත.

යෝජිත උපාධි පාඨමාලා විෂයයන් සකසා ඇත්තේ වෙනස්වනසුලු සමාජ ආර්ථික අවශ්‍යතාවන් හා ක්ෂේත්‍රය මගින් බලාපොරොත්තුවන්නා වූ ඉල්ලීම් සැලකිල්ලට ගනිමිනි. සියලුම පාඨමාලාවන්ගේ නිශ්චිත ක්ෂේත්‍රයන්හි විශේෂිකරණයවන අතරම සියලුම ධාරාවන් වෙත සුදුසු ලෙස අනුකලය වී එමගින් ඕනෑම ව්‍යාපාර හෝ කර්මාන්ත පරිසරයකට හොඳින් මුහුවීමට අනාගත උපාධිධාරීන්ට අවස්ථාව උදා කරනු ඇත. සියලුම උපාධි පාඨමාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙනු ඇත.

## උපාධි පදානය කිරීමේ අනුබද්ධ විශ්වවිද්‍යාල හා ආයතන

ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනය මගින් විශ්වීය ලෙස පිළිගන්නා උපාධි පාඨමාලාවන් පිරිනමනු ලබයි. මේ සඳහා ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනය යුරෝපය හා ආසියාව තුළ ස්ථාපනය වූ හා ලොව පිළිගත් උසස්තම විශ්වවිද්‍යාල හා උපාධි පිරිනමන ආයතන සමඟ දීර්ඝකාලීන සහයෝගිතාවන්ට එළඹ ඇත. ඒවා නම්,

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ශ්‍රී ලංකාව
- ඩබ්ලින් යුනිවසිටි කොජිලිය - අයර්ලන්තය
- ලිම්කොක්වින්ග් නිර්මාණාත්මක තාක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාලය - මලයාසියාව.
- ප්ලයිමවුත් විශ්වවිද්‍යාලය - එක්සත් රාජධානිය

## පිරිනමනු ලබන පාඨමාලා

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ උපාධි විද්‍යායතනය වන ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනය, පරිගනක, කළමනාකරණය හා ඉංජිනේරු විද්‍යාව යනාදී ක්ෂේත්‍රයන්ගේ උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා පිරිනමනු ලබයි. ජාතික ඵලදායිතාවය හා ජනතාවගේ ගුණාත්මකභාවය වැඩිකරනු පිණිස දේශීය සම්පත් උපරිම ලෙස යොදාගැනීම සඳහා වන උපක්‍රමිකව වැදගත් වන විෂය ධාරාවන්ගේ උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීමට විද්‍යායතනය අපේක්ෂා කරයි. සියලුම පාඨමාලාවන් දේශීය හා ජාත්‍යන්තර ඉල්ලීම්වලට ගැළපෙන ලෙස සකසා ඇත. පහත දක්වා ඇත්තේ ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව විද්‍යායතනය මගින් පිරිනැමීමට යෝජිත උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලාවන් ය.

## පරිගණක විද්‍යායතනය

- පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
- කළමනාකරණ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- වෙබ් අඩවි සැලසුම් හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- නිර්මාණාත්මක බහුමාධ්‍ය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
- සජීවීකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
- ඩිජිටල් රූපකරණය හා චිත්‍රණය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
- වෙබ් සංවර්ධනය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- තොරතුරු තාක්ෂණ ආරක්ෂාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- පරිගණක ජාලකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

## ව්‍යාපාර විද්‍යායතනය

- කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- ගණකාධිකරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- ජාත්‍යන්තර ව්‍යාපාර හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- සේවා සැලසුම් හා කළමනාකරණය පිළිබඳ

විද්‍යාවේදී උපාධිය

- සංචාරක කර්මාන්ත කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ව්‍යාපාර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

## ඉංජිනේරු විද්‍යායතනය

- අභ්‍යන්තර සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
- මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය

# අපගේ ක්‍රියාකාරකම්





යුද්ධයේ දී රට වෙනුවෙන් දිවි පිදූ පියවරුන්ගේ දරුවන් දස දෙනෙකුට ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය මගින් ශිෂ්‍යත්ව පිරිනමනු ලබයි.



ලේ දන්දීමේ වැඩසටහන

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සේවකයන් හා ශිෂ්‍යයන්ගේ සහභාගිත්වය ඇතිව 2012 වසරේ දී ලේ දන්දීමේ ව්‍යාපාරයක් ක්‍රියාත්මක විණි.

## ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන ප්‍රධාන කාර්යාලයේ වෙසක් ධර්ම දේශනාව.



කොළඹ ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය හා ශිෂ්‍යයන්ගේ සහභාගිත්වයෙන් පොසොන් පුන් පොහොය දා ධර්ම දේශනාවක් සංවිධානය කෙරිණි.

## නව අවුරුදු සැමරුම හා ක්‍රීඩා උත්සව



සැම වසරකම කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුල්වල සහභාගිත්වයෙන් නව අවුරුදු චාරිත්‍ර හා සමඟින් ක්‍රීඩා උත්සවයක් පැවැත්වේ. 2012 වසරේ දී එය අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශ ක්‍රීඩා පිටියේ දී පැවැත්විණි.

## බැංකොක් වෙත කෙරුණු වාර්ෂික චාරිකාව හා සුහද හමුව





2012 නොවැම්බර් 29 30 සිට දෙසැම්බර් 01 වනදා තෙක් බැංකොක් හි පැවැත්වුණු චාරිකාව හා සුහද හමුව සඳහා කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල් සහභාගි වූහ. වාර්ෂික චාරිකාව හා සුහද හමුව සුබසාධක සංගමය මගින් වාර්ෂිකව සංවිධානය කෙරේ

# ආයතනික සමාජ සත්කාර

ආයතනික සමාජ සත්කාරයන් අපගේ සංවිධානයේ වැදගත් සලකුණක් සේ අපි දකිමු. ඒ, අප ස්වභාවික සම්පත් වන ජලය, භූමිය යනාදිය භාවිතා කරන බැවින් මෙන්ම අපද්‍රව්‍යයන් ද මුදාහරින බැවිනි. අප, අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව හා කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයන්හි උපදේශනයන්හි නිරත වන බැවින් අපගේ ශිෂ්‍යයන් හා ක්‍රියාකාරකම්වලට සහභාගි වන්නන්ගේ වැදගත්කම පිළිබඳව අවධානය යොමු කරන්නෙමු. අවම ඍණාත්මක බලපෑම් ඇති කරනු වස් පිරිසිදු හා ආරක්ෂාකාරී වටපිටාවක් පවත්වාගෙන යන්නෙමු. අපගේ මානව සම්පත් ප්‍රතිපත්තීන් තුළින් සේවකයන්ගේ සුබසාධනය හා පෞද්ගලික ප්‍රතිලාභ වෙත අවධානය යොමු කර ඇත. එම නිසා ගුණාත්මක වැඩ රටාවක් තුළින් ගුණාත්මක ජීවිතයක් වෙත යොමුවීමට අපට හැකි වී ඇත.
ආර්ථිකමය වශයෙන් අපහසුතා ඇති එහෙත් දක්ෂ සිසුන් සඳහා වෘත්තීය උපදේශන සේවා, නොමිලේ සම්මන්ත්‍රණ හා ශිෂ්‍යත්ව ලබාදිම. අප විසින් සිදු කෙරේ. නැඟී එන තරුණ නායකයා සම්මානය හා ගැමි පාසල් වෙත පුස්තකාල පොත් ලබාදීම යනාදිය අපගේ ආයතනික සමාජ සත්කාරයන්හි විශේෂ අංගයන් වේ.

2011/2012 වසර තුළ දී ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය මගින් පහත සඳහන් ආධාර ලබා දී ඇත.

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගංවතුරින් විපතට පත් පාසල් දරුවන්ට රු. 300,000/= ක් ලබාදීම.
- තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ විසින් පැවැත්වූ 'තරුණ වසර හා ගමකට නිවසක්' වැඩසටහන සඳහා රු. 68,200/= ලබාදීම.
- මියගිය හා ආබාධිත රණවිරුවන්ගේ දරුවන්ට අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාදීම. අපොස (උ.පෙළ) දක්වා ඉගෙනීම සඳහා දරුවන් පස් දෙනෙකුට මෙය ලබාදුන් අතර වසර දෙකක් සඳහා රු. 2000 බැගින් වන මාසික ආධාර ලබාදීම.
- සේවකයන් සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය තුළ සුබසාධන සංගමයක්, මරණාධාර සමිතියක් හා වෛද්‍යාධාර වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර ලෝක තොරතුරු ප්‍රවේශ මධ්‍යස්ථානයක් ස්ථාපනය කර ඇත.
- ගාල්ල නියගම ප්‍රාදේශීය සභාව මගින් පැවැත්වූ ලෝක ළමා දිනය හා රාත්‍රී සංස්කෘතික ප්‍රසංගය සඳහා රු. 10,000 ක් මුදලක් ලබාදීම.
- ලෝක කම්කරු සංවිධානය හා සහයෝගයෙන් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද 'ශ්‍රී ලංකා තරුණ හඬ' සඳහා අනුග්‍රාහකත්වය ලබාදීම.
- 2012 සූරිය උදානය වෙනුවෙන් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වෙත රු. 500,000/= ක මුදලක් ලබාදීම.
- දේශීය කාන්තාවගේ සුබසාධනය හා ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ග්‍රාමීය කාන්තා සංවර්ධන අරමුදලට රු. 50,000/= ක් ලබාදීම

# 2012 වසරේ ජයග්‍රහණ

## ISO 9001:2008 **සහතිකය**

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව 2008 වසරේ දී ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2009 වසරේ දී ආයතනය වෙත ISO 9001: 2008 සහතිකය පිරිනමන ලදි. ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගනු වස් සැලසුම් කර ඇති වැඩසටහන් කාර්යක්ෂමතාවයෙන් හා නිරවද්‍යතාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ කැපවීම එමගින් විද්‍යාමාන වේ.


SGS

Certificate SG09/02538

The management system of

National Institute of Business Management

No:120/5, Wijerama Mawatha, Colombo 07, Sri Lanka

has been assessed and certified as meeting the requirements of

ISO 9001:2008

For the following activities

Offering short term and long term Professional certification courses including Diploma, Higher Diploma and Degree Programmes.

This certificate is valid from 01 September 2009 until 31 August 2012 and Remains valid subject to satisfactory surveillance audits. Re certification audit due before 25 August 2012 Issue 1. Certified since 1 September 2009

Authorised by

SGS United Kingdom Ltd. Systems & Services Certification

UKAS QUALITY MANAGEMENT 005

Page 1 of 1

## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය වෙනුවෙන් ඵලදායිතා සම්මානයක්

ඵලදායිතා ප්‍රමිතීන් ළඟා කර ගැනීම උදෙසා ක්‍රමානුකූල හා කාර්යක්ෂම ලෙස තම අරමුණු සාක්ෂාත් කරගැනිම අගයනු වස් 2010 වසරේ දී ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයට ජාතික ඵලදායිතා සම්මාන උළෙලේ දී කුසලතා සහතිකයක් පිරිනමනු ලැබිණි.

# විශිෂ්ටතම ව්‍යාපාර සඳහා වූ ජාතික සම්මානය - 2012




2011 හා 2012 වසර තුළ දී රජයේ ව්‍යාපාරයන් අතර හොඳම ව්‍යාපාර ආයතනය ලෙස ද, සියලුම ව්‍යාපාරයන් අතර දෙවන හොඳම ව්‍යාපාර ආයතනය ලෙස ද, ජාතික වාණිජ මණ්ඩලය සංවිධානය කළ ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන උළෙලේ දී ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ඇගයුමට ලක් විය.



## කර්මාන්ත විශිෂ්ටත්වය උදෙසා CNCI ජයග්‍රාහකයා සම්මානය - 2012




2012 වසරේ දී ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය ජයග්‍රාහකයා සම්මානය ලබා ගත්තේ ය. එය සංවිධානය කරන ලද්දේ ලංකා ජාතික කර්මාන්ත හා වාණිජ මණ්ඩලය විසිනි.

## ගෞරවණීය පුරවැසි සහතිකය - 2012




කොළඹ මහ නගර සභාව විසින් සංවිධානය කරන ලද ගෞරවණීය පුරවැසි සම්මානය 2012 ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය වෙත පිරිනමන ලදී.

## අනාගත ගමන්මඟ

අප මුහුණ දී ඇති අතිශය තරගකාරී පරිසරය හා අපගේ තරගකරුවන් විසින් පිරිනමන්නා වූ අනෙකුත් නිෂ්පාදනයන්ගේ ස්වභාවයත් අපගේ සේවාදායකන්ගේ ඉහළ අවශ්‍යතාවයනුත් අනුව හඳුනාගන්නා ලද ප්‍රධාන ක්ෂේත්‍රයන් පහත පරිදි ය.

1. සරල සහතික පාඨමාලාවෙන් ආරම්භ වී උසස් ඩිප්ලෝමාව මට්ටමේ වැඩසටහන් දක්වා ප්‍රවේශ වීමට හා බැහැර වීමට පහසු මං සහිතව සිසුනට සිය වෘත්තිය මාර්ගය සම්පූර්ණ කරගැනීමට ඉඩ සැලසීම.
2. ප්‍රාදේශීය මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම හා ධාරිතා වර්ධනය.
3. කළමනාකාරීත්වයට හා කළමනාකරණ තොරතුරු පද්ධතියට සම්බන්ධව උපදේශන සේවා ඒකක ස්ථාපිත කිරීම.
4. යටිතල පහසුකම් හා උපකරණ වැඩිදියුනු කරමින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීම.
5. කොළඹ හා ප්‍රාදේශීය මධ්‍යස්ථානවල සේවාලාභීන් හා කාර්ය මණ්ඩලය සඳහා ලොව පිළිගත් මට්ටමේ අධ්‍යයන, විනෝද කටයුතු හා ආපන ශාලා පහසුකම් ලබාදීම..
6. මානව සම්පත් හා පරිපාලනය සඳහා පරිපාටි සංග්‍රහයක් සැකසීම.
7. රජයේ ආයතනයන් හා තරගකරුවන් හා සම වන සේ වැටුප් සංශෝධන ඇති කිරීම
8. පිවිසුම් සහ පිටවුම් පහසු කරන යෝජිත වෘත්තීය මාර්ගයක් සංවර්ධනයට ගැළපෙන ආකාරයෙන් පවත්නා සහතික හා ඩිප්ලෝමා පාඨමාලා සමාලෝචනය හා යාවත්කාලීන කිරීම.
9. අපගේ නිෂ්පාදන හා සේවාවන්ගේ තත්ත්වය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම
10. ප්‍රකාශන හා සඟරා
    - කාර්තුමය/වාර්ෂික ලෙස ආයතනය තුළ සඟරා පළ කිරීම
    - ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා සිසුන්ගේ ඉහළ මට්ටමේ ව්‍යාපෘති වාර්තා ප්‍රකාශයට පත් කිරීම.
11. සහය සේවාවන්ගේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම.

## අංශවල ව්‍යුහය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශවලින් අප වෙත පැමිණෙන සේවාලාභීන්ට ඵලදායී ලෙස සේවා සැපයීම හා ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතියේ නිපුණතා හා හැකියාවන්ගෙන් යුත් ශ්‍රම බළකායක් ඇති කිරීමේ අරමුණ ඇතිව, මෙම ආයතනයේ මෙහෙයුම් කටයුතු අංශ දෙකක් ලෙසින් ව්‍යුහගත කොට ඇත. එම ප්‍රධාන අංශයන් නම්:

- ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය
- කළමනාකරණ තොරතුරු පද්ධති අංශය

## ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය

ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය විසින් රාජ්‍ය හා පුද්ගලික අංශයන් සඳහා විවිධ විෂයයන්ට අදාළ උපාධි පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමේ අවස්ථාව සලසා දී ඇත.

- කළමනාකරණ සංවර්ධන වැඩසටහන්.
- ඵලදායිතා හා ගුණත්ව වර්ධන වැඩසටහන්
- උපදේශන සේවා
- භාෂා වැඩසටහන්
- පරිගණක යෙදවුම් වැඩසටහන්
- විශේෂ ලෙස සකසන ලද පුහුණු වැඩසටහන්

මෙහි ප්‍රධාන අරමුණ නම් ව්‍යාපාර ආයතනය හා පුද්ගලයින්ගේ ඵලදායිතා හා කළමනාකරණ භාවිතය සංවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීමයි. මෙම අංශය මගින් පුහුණු, අධ්‍යාපන හා උපදේශන සේවා යන ක්ෂේත්‍රයන්ට අදාළව පුළුල් පරාසයකින් යුත් නිපැයුම් පිරිනමනු ලබයි. මෙමගින් පාසල් හැරයන්නන්ගේ සිට ඉහළ මට්ටමේ වෘත්තිකයන් දක්වා පරාසයක් සඳහා සේවා සපයනු ලබයි. මෙම අධ්‍යාපන හා පුහුණු අවස්ථාවන් රාජ්‍ය හා පෞද්ගලික අංශවල මේ සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයන් හා ආයතන සඳහා නිර්දේශ කරනු ලැබේ.

දශක ගණනාවක් මුළුල්ලේ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයතන සඳහා ඵලදායිතා හා තත්ත්ව කළමනාකරණ පද්ධති හඳුන්වාදීමේ ප්‍රමුඛස්ථානයක් උසුලයි. මෑතක දී මෙම අංශය මගින් Lean manufacturing and six sigma systems යන

ලොව පිළිගත් ඵලදායිතා හා ගුණත්ව වර්ධන ක්‍රම හඳුන්වා දෙන ලදී. Lean and six sigma systems භාවිතා කොට ශ්‍රී ලංකාවේ කර්මාන්ත විශාල ප්‍රමාණයක් තම තත්ත්ව හා ඵලදායිතාවය වර්ධනය කරගැනීමට යොමු වී ඇත.

මෙම අංශය එහි උපදේශන කටයුතු සම්බන්ධව ඉහළ මට්ටමක වෘත්තිකභාවයක් පෙන්නුම් කරයි. අපගේ උපදේශනයන්, සියලුම කරුණු හා අදහස් පිළිබඳ වාස්තවික විශ්ලේෂණයක් මත පදනම් වූ ස්වාධීන උපදේශනයකි. අභ්‍යන්තර හා බාහිර වෘත්තිකයන්ගේ සමන්විත ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ උපදේශන කණ්ඩායම, ඕනෑම උපදේශන ව්‍යාපෘතියක් මෙහෙයවීමට හැකි පරිදි තාක්ෂණික හා කළමනාකරණ නිපුණතායෙන් ද, මනා පරිචයක් සඳහා අවශ්‍ය පළපුරුද්ද හා අත්දැකීම්වලින් ද පොහොසත් ය.

## පුහුණු වැඩසටහන්

2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය විසින් වැඩසටහන් 108 ක් පවත්වා ඇත. මෙම වැඩසටහන් සඳහා ඉහළ ඩිප්ලෝමා වැඩසටහන් 02 ක් උසස් ඩිප්ලෝමා වැඩසටහන් 23 ක්, ඩිප්ලෝමා වැඩසටහන් 03 ක්, උසස් සහතික පත්‍ර වැඩසටහන් 31 ක්, සහතිකපත්‍ර වැඩසටහන් 18 ක්, පදනම් වැඩසටහන් 07 ක් අභයන්තර වැඩසටහන් 13 ක් හා කෙටිකාලීන වැඩසටහන් 11 ක් ඇතුළත් ය.

2011 හා 2012 වර්ෂයන් තුළ ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය විසින් පවත්වන ලද වැඩසටහන්වල සාරාංශය පහත වගුවෙන් දක්වේ.

| | වැඩසටහන් වර්ගය | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|
| | | පාඨමාලා ගණන | සහභාගිවූවන් ගණන | පාඨමාලා ගණන | සහභාගිවූවන් ගණන |
| 1 | විද්‍යාපති උපාධි වැඩසටහන් | 01 | 22 | - | - |
| 2 | උපාධි වැඩසටහන් | 04 | 508 | - | - |
| 3 | ඉහළ ඩිප්ලෝමා වැඩසටහන් | 04 | 466 | 02 | 272 |
| 4 | උසස් ඩිප්ලෝමා වැඩසටහන් | 18 | 1,087 | 23 | 1,207 |
| 5 | ඩිප්ලෝමා වැඩසටහන් | 03 | 294 | 03 | 113 |
| 6 | උසස් සහතිකපත්‍ර වැඩසටහන් | 25 | 1,013 | 31 | 1,455 |
| 7 | සහතිකපත්‍ර වැඩසටහන් | 15 | 674 | 18 | 672 |
| 8 | පදනම් වැඩසටහන් | 06 | 330 | 07 | 367 |
| 9 | කෙටිකාලීන වැඩසටහන් | 12 | 294 | 12 | 221 |
| 10 | අභ්‍යන්තර වැඩසටහන් | 19 | 492 | 13 | 271 |
| | එකතුව | **107** | **5,180** | **109** | **4,578** |

වගුව 04 - ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් පවත්වන ලද වැඩසටහන්




ප්‍රස්තාරය 04: ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් පවත්වන ලද පාඨමාලා

## ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගිත්වය

2012 වසර තුළ 4,771 ක ප්‍රමාණයක් ඵලදායිතා හා කළමනාකරන සංමවර්ධන අංශයේ වැඩසටහන් සඳහා සහභාගි වූහ. මෙයින් 272 ක් ඉහළ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ද, 1,207ක් උසස් ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ද, 113 ක් ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ද, 1,482 ක් උසස් සහතිකපත්‍ර පාඨමාලා සඳහා ද, 672ක් සහතිකපත්‍ර පාඨමාලා සඳහා ද, 367 ක් පදනම් පාඨමාලා සඳහා ද, 658 කෙටි කාලීන වැඩසටහන් සඳහා ද සහභාගි විය.

## ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශයේ සංවර්ධන ප්‍රයත්නයන්

පෞද්ගලික අංශයේ සේවාලාභීන්ගේ අවශ්‍යතාවන්ට අනුව පුහුණු වැඩසටහන් සැකසීමට විවිධ උත්සාහයන් ගන්නා ලදී. ඒ අනුව මෙම වසර තුළ එම පුහුණු වැඩසටහන් හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන් අතරින් ඵලදායිතාව හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් හඳුන්වා දෙන ලද පාඨමාලා ප්‍රධානවේ. මෙම වසර තුළ ඉංග්‍රීසි භාෂා පුහුණුව පිළිබඳ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. නව වැඩසටහන් සැකසීම සඳහා ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.

- පාරිභෝගික ඇගයීම් පද්ධතිය ස්ථාපනය හා වැඩිදියුණු කිරීම
- පාරිභෝගිකයන් සඳහා යාවත්කාලීන දත්ත බැංකුවක් පවත්වාගෙනයාම හා ඔවුන් අතර ආයතනයේ කීර්තිනාමය වර්ධනය කිරීම.
- නව වෙළෙඳ ප්‍රචාරණ ක්‍රමවේද හඳුන්වාදීම.
- පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සැපිරීමට හැකි ආකාරයේ වැඩසටහන් ප්‍රවර්ධනය
- අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහාවිශේෂ අවධානයක් යොමු කිරීම

## ඉංග්‍රීසි භාෂා ඒකකය

ඉංග්‍රීසි භාෂා ඒකකය එක් පූර්ණකාලීන උපදේශකයකුගෙන් යුක්තව 2006 නොවැම්බර් මස ස්ථාපනය කරන ලදී. දැන් එම ඒකකය පූර්ණකාලීන උපදේශකයන් තිදෙනෙකුගෙන් යුක්තව ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශයේ අධ්‍යක්ෂ යටතේ ක්‍රියාත්මක වේ. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය සියලුම ආකාරයේ ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි භාෂා නිපුණතාව වර්ධනය කිරීම සඳහා ප්‍රසිද්ධියක් උසුලන අතරම, පුද්ගලික හා රාජ්‍ය අංශවල සේවකයන් සඳහා ඉංග්‍රීසි භාෂා වැඩසටහන් හා අභ්‍යන්තර ඉංග්‍රීසි භාෂා වැඩසටහන් සාර්ථක ලෙස පවත්වා ඇත.

ගුණාත්මක ඉංග්‍රීසි භාෂා වැඩසටහන් සඳහා දිනෙන් දින ඉහළ යන ඉල්ලුමට සරිලන පරිදි, සහභාගි වන්නන්ට ඉංග්‍රීසි භාෂා භාවිතය පිළිබඳ දක්ෂතාවය වර්ධනය කරගැනීමට හැකි ලෙස සහතික පත්‍ර මට්ටමේ සිට ඩිප්ලෝමා මට්ටම දක්වා වැඩසටහන් කිහිපයක්ම ඉංග්‍රීසි ඒකකය විසින් සැලසුම් කොට ඇත. සාර්ථක වෘත්තිය ගමන් මගක් සඳහා ශක්තිමත් පදනමක් ලෙස ඉංග්‍රීසි භාෂා ශක්‍යතාවය වර්ධනය කර ගැනීමට උනන්දුවක් දක්වන අයට මෙම වැඩසටහන් ඉතා යෝග්‍ය වේ. ඉංග්‍රීසි ඒකකය විසින් දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි හදාරන සියලුම ආකාරයේ සිසුන් හැසිරවීමේ මනා අත්දැකීම් ඇති, සුදුසුකම්ලත් සම්පත්දායකයින්ගේ සේවාව ලබාගනී. සන්නිවේදන මාධ්‍යයක් ලෙස ඉංග්‍රීසි භාෂාව විශ්වාසයෙන් යුතුව භාවිතා කිරීම සඳහා ශිෂ්‍යයින්ට ඔවුන්ගේ මග පෙන්වීම ඉතා වැදගත් ය. නව ඉංග්‍රීසි භාෂා ඒකකය රට තුළ හා ක්ෂේත්‍රය තුළ ඉංග්‍රීසි භාෂා ශක්‍යතාවය පිළිබඳ පුහුණුව සපයන ස්ථානයක් ලෙස කටයුතු කරන අතරම, අනෙකුත් දේශීය හා විදේශීය භාෂා පිළිබඳ භාෂා සංවර්ධන වැඩසටහන් පුළුල් කිරීමේ සැලැස්මක් ද එම ඒකකයට ඇත.

## ආදායම් උත්පාදනය

2012 වසර තුළ ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය රු. මි. 228 ක ආදායමක් උපයා ගන්නා ලදි. පසුගිය වර්ෂයන් සමග සන්සන්දනය කර බැලීමේ දී ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශයේ ආදායම් ඉපයීම්වල සැලකිය යුතු මට්ටමක වර්ධනයක් ඇති බව පහත දැක්වෙන වගුවෙන් හා ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.

**ආදායම් උත්පාදනය - ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය**

| | රු. මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
| ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් උපයන ලද ආදායම | 96 | 132 | 216 | 327 | 232 |

වගුව 05- ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් උපයන ලද ආදායම




ප්‍රස්තාරය 05- ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් උපයන ලද ආදායම

## කළමනාකරණ තොරතුරු පද්ධති අංශය

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ සුදුසුකම් හා පුහුණුව ලබාදීමේ පුරෝගාමී ආයතනය වේ. මෙම අංශය විසින්, සහභාගිවන්නන් සඳහා පිළිගත් සුදුසුකම් ලබාගැනීමට හා රැකියාවක් සඳහා අවශ්‍ය නිපුණතා ලබාගැනීම හැකිවන පරිදි පරිගණක වැඩසටහන් පවත්වනු ලබයි. නවීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි පාඨමාලා මොඩියුලයන් නිතිපතා යාවත්කාලීන කරනු ලබයි.

මෙම අංශය මගින් ඉහළ ඩිප්ලෝමා, ඩිප්ලෝමා වැඩසටහන් හා සහතකි පත්‍ර පාඨමාලා කිහිපයක් පවත්වනු ලබයි. මෙහි ප්‍රධාන පරිගණක වැඩසටහන් වන්නේ පරිගණක පද්ධති සැලසුම් (Computer system design) පිළිබඳ එක් අවුරුදු පාඨමාලාව පරිගණක පදනම් කරගත් තොරතුරු පද්ධති (Computer based information systems) පිළිබඳ වසර 2 ක ඉහළ ඩිප්ලෝමා වැඩසටහන් යනාදියයි. මෙලෙස මැනවින් ව්‍යුහගත කරන ලද පරිගණක පුහුණු වැඩසටහන්, ශිෂ්‍යයන් අතර මෙන්ම දේශීය හා විදේශීය සේවායෝජකයින් අතර ද මනා පිළිගැනීමකට පාත්‍රව ඇත.

2006 මැයි මස සිට කළමනාකරණ තොරතුරු පද්ධති අංශය අන්තර්ජාතික පරිගණක සහතික බලපත්‍රය (International computer driviry license) සඳහා පුහුණුව පිළිබඳ සහතික කළ විභාග මධ්‍යස්ථානයක් ලෙස පිළිගනු ලැබී ය. 2008 වසරේ සිට මෙම අංශය මගින් ලබාදුන් ගුණාත්මක අධ්‍යාපන හා සේවාවන් පිළිගැනීමකට ලක්කරමින්, මෙම අංශය විසින් ISO 9001:2000 සහතිකය දිනාගන්නා ලදී..

## කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ වෙනත් ක්‍රියාකාරකම්

මෙම අංශය මගින් 2012 වසරේ දී වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. එනම් ඩිප්ලෝමා වැඩසටහන් 07 ක් ඉහළ ඩිප්ලෝමා වැඩසටහන් 03 ක් පරිගණක සහතිකපත්‍ර වැඩසටහන් 22 ක් වෙනත් වැඩසටහන් 06 ක් යනාදී වශයෙනි.

### කළමනාකරණ තොරතුරු පද්ධති අංශය මගින් පවත්වන ලද වැඩසටහන්

| | වැඩසටහන් වර්ගය | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|
| | | පාඨමාලා ගණන | සහභාගිවූවන් ගණන | පාඨමාලා ගණන | සහභාගිවූවන් ගණන |
| i. | පශ්චාත් උපාධි (විද්‍යාපති) | 01 | 41 | - | - |
| ii. | උපාධි වැඩසටහන් (විද්‍යාපති) | 06 | 658 | - | - |
| iii. | ඉහළ ඩිප්ලෝමා පාඨමාලා | 02 | 338 | 03 | 416 |
| iv. | ඩිප්ලෝමා පාඨමාලා | 04 | 644 | 07 | 578 |
| v. | සහතිකපත්‍ර පාඨමාලා | 25 | 1,222 | 25 | 1,237 |
| vi. | වෙනත් | 04 | 56 | 06 | 134 |
| | එකතුව | 42 | 2,959 | 41 | 2,365 |

වගුව 06 - කළමනාකරන තොරතුරු පද්ධති අංශය මගින් පවත්වන ලද වැඩසටහන්



ප්‍රස්ථාරය 06- කළමනාකරණ තොරතුරු පද්ධති අංශය මගින් පවත්වන ලද වැඩසටහන්

## ආදායම් උත්පාදනය

2012 වසර තුළ කළමනාකරණ තොරතුරු පද්ධති අංශය මගින් උපයන ලද ආදායම රු.මි. 152 කි.

පහත දැක්වෙන 09 වගුව මගින් 2012 වසරේ උපයන ලද ආදායම එයට පෙර වසරවලට වඩා වැඩි බව පෙන්නුම් කෙරේ.

### ආදායම් උත්පාදනය - කළමනාකරණ තොරතුරු පද්ධති අංශය

| | රු. මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
| කළමනාකරණ තොරතුරු පද්ධති අංශය මගින් උපයන ලද ආදායම | 144 | 181 | 184 | 245 | 152 |

වගුව 07- කළමනාකරණ තොරතුරු පද්ධති අංශය මගින් උපයන ලද ආදායම



ප්‍රස්ථාරය 07 - කළමනාකරණ තොරතුරු පද්ධති අංශය විසින් උපයන ලද ආදායම

## ප්‍රාදේශිය මධ්‍යස්ථාන

කළමනාකරණ පුහුණුව ප්‍රාදේශිය මට්ටමක ගෙනයමින්, 2012 වසර වන විට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය ප්‍රාදේශීය මධ්‍යස්ථාන තුනක් ආරම්භ කොට ඇත.

## කුරුණෑගල ප්‍රාදේශිය මධ්‍යස්ථානය

1986 දී විවෘත කරන ලද කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන පාඨමාලා වනුයේ: පරිගණක පද්ධති නිර්මාණය පිළිබඳ පූර්ණකාලින ඩිප්ලෝමා පාඨමාලාව හා ඉහළ ඩිප්ලෝමා පාඨමාලාව, පරිගණක යෙදවුම් පිළිබඳ ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ හා ව්‍යාපාර කළමනාකරණය ඩිප්ලෝමා පාඨමාලා, පදනම් පාඨමාලා, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා, උසස් සහතික පත්‍ර හා සහතික පත්‍ර පාඨමාලා.

මෙම වැඩසටහන් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා 2008 ඔක්තෝබර් 31 වන දින නව ගොඩනැගිල්ලක් විවෘත කළ අතර, එම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි. 141 විය. එය මහල් හතරකින් යුතු ගොඩනැගිල්ලක් වන අතර පහත දැක්වෙන පහසුකම්වලින් සමන්විත ය.

- සියලු අංගෝපාංගයන්ගෙන් සමන්විත දේශන ශාලා.
- අවශ්‍ය සියලු උපකරණවලින් සමන්විත පරිගණක පර්යේෂණ විද්‍යාගාරයක්
- නවීන ශ්‍රවණාගාරයක්
- පුස්තකාලයක්
- අන්තර්ජාල හා බ්‍රෝඩ්බෑන්ඩ් (Broadband) පහසුකම්
- සුඛසාධන හා ආපනශාලා පහසුකම්
- සියලු පහසුකම් සහිත බද්ධ නිවාස දෙකක්
- වාහන නැවැත්වීමේ පහසුකම්

2011 හා 2012 වසර තුළ කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දී පහත දැක්වෙන පාඨමාලා පවත්වන ලදී.

| | වැඩසටහන් වර්ගය | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|
| | | පාඨමාලා ගණන | සහභාගිවූවන් ගණන | පාඨමාලා ගණන | සහභාගිවූවන් ගණන |
| i. | ඉහළ ඩිප්ලෝමා වැඩසටහන් | 08 | 240 | 03 | 77 |
| ii. | ඩිප්ලෝමා වැඩසටහන් | 04 | 178 | 10 | 353 |
| iii. | උසස් සහතිකපත්‍ර පාඨමාලා | 08 | 297 | 07 | 276 |
| iv. | සහතිකපත්‍ර පාඨමාලා | 08 | 419 | 08 | 344 |
| v. | පදනම් වැඩසටහන් | 04 | 133 | 07 | 190 |
| vi. | අභ්‍යන්තර වැඩසටහන් | 02 | 30 | - | - |
| | එකතුව | **34** | **1,297** | **35** | **1,329** |

වගුව 08 - කුරුණෑගල මධ්‍යස්ථානයේ දී පවත්වන ලද වැඩසටහන්




ප්‍රස්ථාරය 08- කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් උපයන ලද ආදායම

## ආදායම් උත්පාදනය

කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ කළමනාකරණ සංවර්ධන අංශය හා කළමනාකරණ තොරතුරු පද්ධති අංශය රු. මිලියන 66 ආදායමක් 2012 වසරේ දී උපයා ගන්නා ලදී. කුරුණෑගල මධ්‍යස්ථානයේ ආදායම සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇති බව පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

| | රු. මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
| කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් උපයන ලද ආදායම | 11 | 33 | 54 | 61 | 66 |

වගුව 07- කළමනාකරණ තොරතුරු පද්ධති අංශය මගින් උපයන ලද ආදායම




ප්‍රස්ථාරය 09- කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් උපයන ලද ආදායම

# මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය

පරිගණක හා කළමනාකරණ සංවර්ධන අධ්‍යාපනය සඳහා මධ්‍යම පළාතේ වැඩිවන ඉල්ලුම සපුරාලීමට 1996 වසරේ දී මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය (පේරාදෙණිය මාර්ගයේ පිහිටි) ආරම්භ කරන ලදි. පසුව මෙම මධ්‍යස්ථානය වඩාත් ඉඩ පහසුකම් හා නවීන පහසුකම්වලින් සමන්විත අස්ගිරිය මාර්ගයේ පිහිටා ඇති සිව්මහල් ගොඩනැගිල්ලක ස්ථාපනය කරන ලදී. අධ්‍යාපනයට වඩාත් උචිත පහසුකම් හා පරිසරයකින් සමන්විත මෙම මධ්‍යස්ථානය වඩා යහපත් ප්‍රතිඵල ළඟා කරදෙනු ඇතැයි අපේක්ෂිත ය. මෙම මධ්‍යස්ථානයේ කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ වැඩසටහන් කිහිපයක් පවත්වනු ලබයි. මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ 2011 හා 2012 වසර තුළ පවත්වන ලද පාඨමාලා පහත සාරාංශ කර ඇත.

| | වැඩසටහන් වර්ගය | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|
| | | පාඨමාලා ගණන | සහභාගිවූවන් ගණන | පාඨමාලා ගණන | සහභාගිවූවන් ගණන |
| i. | ඉහළ ඩිප්ලෝමා වැඩසටහන් | - | - | - | - |
| ii. | ඩිප්ලෝමා වැඩසටහන් | 08 | 95 | 01 | 36 |
| iii. | උසස් සහතිකපත්‍ර පාඨමාලා | 02 | 138 | 05 | 259 |
| iv. | සහතිකපත්‍ර පාඨමාලා | 03 | 255 | 06 | 379 |
| v. | පදනම් වැඩසටහන් | 04 | 248 | 08 | 312 |
| vi. | අභ්‍යන්තර වැඩසටහන් | 05 | 211 | 05 | 217 |
| | එකතුව | **22** | **947** | **25** | **1,203** |

වගුව 10- මහනුවර මධ්‍යස්ථානයේ පවත්වන ලද පාඨමාලා




ප්‍රස්ථාරය 10- මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දී පැවැත්වූ පාඨමාලා

## ආදායම් උත්පාදනය

මහනුවර ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ කළමනාකරණ සංවර්ධන අංශය සහ කළමනාකරණ තොරතුරු පද්ධති අංශය 2012 වසර තුළ උපයන ලද ආදායම රු. මිලියන 53 කි. මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් උපයන ලද ආදායම වසරින් වසර ඉහළ ගොස් ඇති බව පහත වගුව මගින් පෙනීයයි.

**ආදායම් උත්පාදනය - මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය**

| | රු. මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
| මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් උපයන ලද ආදායම | 9 | 11 | 23 | 35 | 53 |

වගුව 11- මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් උපයන ලද ආදායම




ප්‍රස්තාරය 11- ආදායම් උත්පාදනය - මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය

## ගාල්ල ප්‍රාදේශිය මධ්‍යස්ථානය

දකුණු පළාත සඳහා කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ අධ්‍යාපන පහසුකම් සැපයීම අරමුණු කරගෙන මෙම මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. එය අලුතින් ඉදිකරන ලද, සියලු අංගෝපාංගයන්ගෙන් සමන්විත ආයතනයක් වන අතර, ආයතනයෙන් උසස් අධ්‍යාපනය ලැබීමට පැමිණෙන සියලු ශිෂ්‍යයන් සඳහා පියවරෙන් පියවර අධ්‍යාපනය හා වෘත්තිය මාර්ග විවරකරදීම සහතික කරයි. 2012 දී ආරම්භ කළ ගාල්ල මධ්‍යස්ථානයේ දී කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රයන්ට අදාළ උපාධි වැඩසටහන්, ඩිප්ලෝමා වැඩසටහන්, සහතික පත්‍ර වැඩසටහන්, අභ්‍යන්තර වැඩසටහන්, වැඩමුළු හා පුහුණු වැඩසටහන් හැදෑරීමේ හැකියාව ඇත. මෙම ප්‍රදේශයන් හි දිනෙන් දින ඉහළ යන පුහුණු හා අධ්‍යාපන අවශ්‍යතා සැපිරීම සඳහා ලොව පිළිගත් පහසුකම් සහිත අධ්‍යාපන පරිසරයක් තුළ, ගුණාත්මක බවින් යුතු වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අවස්ථා ග්‍රාමීය ප්‍රදේශවලට ලබාදීමේ අරමුණ ඇතිව ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය වැඩසටහන් ව්‍යාප්ත කිරීම ආරම්භ කොට ඇත. ඉහත කී අරමුණ පෙරදැරි කරගෙන, තරුණ ප්‍රජාවගේ අපේක්ෂාවන් හා ක්ෂේත්‍රය තුළ සුදුසුකම් ලත් හා පුහුණුව ලත් පුද්ගලයන්ට පවතින ඉල්ලුම සැපිරීම සඳහා, අනාගතයේ දී ප්‍රධාන නගරවල ප්‍රාදේශිය මධ්‍යස්ථාන ඉදිකෙරෙනු ඇත. 2011 හා 2012 වර්ෂයන් තුළ ගාල්ල මධ්‍යස්ථානයේ දී පහත දැක්වෙන වැඩසටහන් පවත්වන ලදි.

| | වැඩසටහන් වර්ගය | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|
| | | පාඨමාලා ගණන | සහභාගිවූවන් ගණන | පාඨමාලා ගණන | සහභාගිවූවන් ගණන |
| i. | ඉහළ ඩිප්ලෝමා වැඩසටහන් | 04 | 46 | 08 | 206 |
| ii. | ඩිප්ලෝමා වැඩසටහන් | 09 | 308 | 08 | 368 |
| iii. | උසස් සහතිකපත්‍ර පාඨමාලා | 06 | 255 | 08 | 311 |
| iv. | සහතිකපත්‍ර පාඨමාලා | 08 | 288 | 08 | 332 |
| v. | පදනම් වැඩසටහන් | 04 | 143 | 03 | 95 |
| vi. | අභ්‍යන්තර වැඩසටහන් | - | - | - | - |
| | එකතුව | **31** | **1,040** | **35** | **1,312** |

වගුව 12- ගාල්ල මධ්‍යස්ථානයේ දී පවත්වන ලද පාඨමාලා




ප්‍රස්ථාරය 12 - ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී පවත්වන ලද පාඨමාලා

## ආදායම් උත්පාදනය

ගාල්ල මධ්‍යස්ථානයේ කළමනාකරණ සංවර්ධන හා තොරතුරු පද්ධති අංශය විසින් උපයන ලද ආදායම රු. මිලියන 62 කි. ගාල්ල මධ්‍යස්ථානය විසින් උපයන ලද ආදායම 2012 වර්ෂය තුළ ඉහළ ගොස් ඇති බව පහත වගුව මගින් පෙන්නුම් කෙරේ.

**ආදායම් උත්පාදනය - ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය**

| | රු. මිලියන | | |
|---|---|---|---|
| | 2010 | 2011 | 2012 |
| ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් උපයන ලද ආදායම | 32 | 48 | 62 |

වගුව 13 - ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන පාඨමාලා




ප්‍රස්තාරය 13 - ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් උපයන ලද ආදායම

# පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය





ශිෂ්‍යයන්ගේ හා ගුරු මණ්ඩලයේ පරිශීලන අවශ්‍යතාවන් සැපිරීම සඳහා අවශ්‍ය පහසුකම් සියල්ලෙන්ම සපිරි පුස්තකාලයක් මෙම ආයතනය සතු ය.

## අරමුණු

පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ අරමුණු වන්නේ, දැනුම හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට අවශ්‍ය තොරතුරු සැපයීම, ආයතනය මගින් ආවරණය කරනු ලබන පුහුණු ක්ෂේත්‍රයට අවශ්‍ය තොරතුරු ලබා දීම හා උපදේශන සේවා සඳහා පහසුකම් සැපයීම සඳහා ප්‍රමාණවත් සම්පත් සැපයීම යනාදියයි.

## වර්ගීකරණ ක්‍රමය

පුස්තකාලය විසින් භාවිතා කරන වර්ගීකරණ ක්‍රමය 'විශ්ව දශම වර්ගීකරණය'යයි. 1990 අප්‍රේල් මස දී මෙම පුස්තකාලය යුනෙස්කෝව (UNESCO) මගින් හඳුන්වා දුන් පරිගණක පාදක කරගත් ග්‍රන්ථ විද්‍යාත්මක වර්ගීකරණය භාවිත කිරීම ආරම්භ කරන ලදි. මේ සඳහා Micro CD's/ ISIS හා Winsis මෘදුකාංග පැකේජයන් අයත් වේ. මෙහිදී, Visual Basic ක්‍රමය Access නව අනුවාදය සමඟ භාවිතා කරනු ලැබේ. පුස්තකාලය, සාමාන්‍ය සතියේ කාර්යාල වේලාව තුළ දී මෙන්ම සෙනසුරාදා හා ඉරිදා දිනවල දී ද විවෘතව තබයි.

## විෂයයන්

ව්‍යාපාර කළමනාකරණය, ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය, කාර්මික ඉංජිනේරු විද්‍යාව, වාස්තු විද්‍යාව, අලෙවි කළමනාකරණය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාරික නීතිය, සුළු පරිමාන කර්මාන්ත, පර්යේෂණ ක්‍රම පුහුණුව, මනෝ විද්‍යාව, සංඛ්‍යානය, පරිගණක විද්‍යාව, සන්නිවේදනය, ඵලදායිතාව, මහජන සම්බන්ධතා, කාර්යාල පරිපාලනය, ඉලෙක්ට්‍රොනික, ඉංග්‍රීසි හා දෙමළ භාෂා යන විෂයයන් ආයතනයේ අධ්‍යාපනික වැඩසටහන් යටතේ ආවරණය කරනු ලබන විෂයයන් වේ.

## සේවා

පුස්තකාලය මගින් ග්‍රන්ථ විමර්ශන කිරීමේ හා බැහැර රැගෙන යාමේ පහසුකම් සපයනු ලැබේ. සුචිපත්‍ර සංසරණය, ප්‍රතිග්‍රහණ ලයිස්තු, සඟරාවල පටුන පිටු සේවා යනාදිය මෙමගින් ලබාදෙන අනෙකුත් සේවා වේ. පුස්තකාලයේ දත්ත පද්ධතිය භාවිතා කොට තොරතුරු සොයාගැනීම ද ඇතුළු වරණීය තොරතුරු ලබාදීම ද පුස්තකාලය මගින් සිදුවන අතර දැනුවත් කිරීමේ සේවාවන් ද සපයනු ලබයි. අන්තර් පුස්තකාල ග්‍රන්ථ බැහැරදීමේ ක්‍රමවේදය, ප්‍රලේඛණ සේවය, ඡායා පිටපත් සේවය, තොරතුරු හා උපදෙස් සේවා, අන්තර්ජාලයට නොමිලේ පිවිසීමේ පහසුකම, හා විද්‍යුත් තැපැල ඔස්සේ තොරතුරු සමුද්ධරණය යනාදි ප්‍රතිලාභ ද පුස්ථකාලය පරිහරනය කරන්නට හිමිවේ.

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය පිළිබඳ තොරතුරු අඩංගු වාර්තා ද ඇතුළුව පුවත්පත් ලිපි එක්රැස් කිරීම, සුචිපත්‍ර සම්පාදනය, ග්‍රන්ථ ප්‍රදර්ශන පැවැත්වීම, තොරතුරු හුවමාරු කිරීමේ සේවා, අන්තර් පුස්තකාල සම්බන්ධතා හා තොරතුරු සැකසීම සඳහා ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සහාය ලබාදීම, යනාදිය පුස්තකාලයේ විශේෂ කාර්යයන් වේ.

## සම්පත්

| වර්ගය | 2011 | 2012 |
|---|---|---|
| පොත් (කොළඹ ප්‍රධාන ශාඛාව) | 26186 | 26539 |
| කුරුණෑගල, ගාල්ල, හා මහනුවර ශාඛා මගින් ලබාගත් ග්‍රන්ථ | 2850 | 2900 |
| උපදේශන වාර්තා | 200 | 200 |
| පුවත්පත් ලිපි එකතුව | 475 | 500 |
| දෘෂ්‍ය සම්පත් එකතුව | 71 | 71 |
| වාර සඟරා (දැනට ලබා ගැනීම්) | 65 | 65 |
| වාර සඟරා එකතුව | 175 | 175 |
| ශ්‍රව්‍ය සම්පත් එකතුව | 30 | 30 |
| සිතියම් | 10 | 10 |
| ව්‍යාපෘති වාර්තා | 4450 | 4500 |
| පොත් පිංච | 85 | 85 |
| සංයුක්ත තැටි | 510 | 520 |

## විශේෂ එකතුවන්

- ශ්‍රී ලංකා එකතුව
- ආසියා ඵලදායිතා සංවිධානයේ ප්‍රකාශන එකතුව
- සමාගම් වාර්ෂික වාර්තා
- පුහුණු කටයුතුවලට අදාළ තොරතුරු
- ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ උපදේශන වාර්තා
- වාර සඟරා එකතුව
- ශිෂ්‍යයන්ගේ ව්‍යාපෘති වාර්තා
- ශ්‍රව්‍ය/දෘෂ්‍ය තොරතුරු එකතුව
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රකාශන
- දෙමළ භාෂාව පිළිබඳ ප්‍රකාශන
- ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ ප්‍රකාශන

## 2012 වසර තුළ පුස්තකාලයට මිලදී ගත් ග්‍රන්ථ

2011 වසර තුළ ප්‍රසම්පාදන තොරතුරු පහත පරිදි වේ.

| | |
|---|---|
| 2012 වසර තුළ මිලටගත් ග්‍රන්ථ වල වටිනාකම | රු. 409,505.00 |
| 2012 වසර තුළ මිලටගත් වාර සඟරා වල වටිනාකම | රු. 282,507.93 |
| එකතුව | රු. 692,012.93 |

## වෛද්‍ය මධ්‍යස්ථානය




ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ශිෂ්‍යයන් හා කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් මට්ටමින් පවත්වා ගැනීම සඳහා වෛද්‍ය සායනයක් ආරම්භ කොට ඇත. මෙම සායනයේ දී MBBS සහතිකයක් ලත් වෛද්‍යවරයකුගේ හා හෙද නිලධාරියකුගේ සේවාව ලබාගත හැක.



## අධ්‍යයන ස්ථානය හා ආපන ශාලාව

සියලු පහසුකම්වලින් සමන්විත ශිෂ්‍ය විවේකාගාරයක් හා ආපන ශාලාවක් ආරම්භ කොට ඇති අතර, ශිෂ්‍යයන්ට ඔවුන්ගේ විවේක කාලය ගතකිරීමට හා ආහාර පාන ලබාගැනීමට හැකිවන පරිදි සතියේ දින 7 තුළම එය විවෘතව පවතී.



මගේ අංකය / எனது இல. / My No. : ජේපී/එෆ්/එන්අයිබීඑම්/එෆ්ඒ/33/2012
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2014 ජූලි 10 දින

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය
14 JUL 2014
කොළඹ - 07.

සභාපති,

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය

**ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශන, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනත සහ 1991 අංක 28 දරන සංශෝධිත පනතේ 24 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාලිත සමාගමේ ගිණුම් විගණනය කරන ලද්දේ එහි සාමාජිකයන් විසින් පත්කරන ලද වරලත් ගණකාධිකරණ ආයතනයකිනි. මුදල් පනතේ 14 (2) සී වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කල යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිතිය අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

## 2.1 මතය - ආයතනය

------------------

2012 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**මතය - සමූහය**

-----------------

2012 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය හා එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ පූර්ණ අයිතියක් ඇති අනුබද්ධිත ආයතනයක් ලෙස ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනය 2011 ඔක්තෝබර් 07 දින පිහිටුවා තිබුණි.

### 2.2.2 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගණුදෙනු හෙලිදරව් නොකිරීම

ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යායතනය පිහිටුවීම පිළිබඳ ක්‍රියාවලින් සිදු වූ කාල පරිච්ඡේදය තුල ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් කටයුතු කල අයකු ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යායතනයේ විගණක වශයෙන් කටයුතු කරන වෘත්තීය විගණන සමාගමේ හවුල්කරුවකු ලෙසද කටයුතු කර තිබූ නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

### 2.2.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 විධි විධාන ප්‍රකාරව ශුද්ධ වත්කම් රුපියලට පෙන්වූ අයිතම 13 ක් නැවත තක්සේරු කර 2012 දෙසැම්බර් 31 දිනට ගිණුම් ගත කර නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1991 අංක 28 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනතේ 6 වගන්තිය | අධ්‍යක්ෂ ජනරාල්, අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන තිදෙනෙකු සමග වෙනත් ව්‍යාපාර ආයතන නියෝජනය වන සාමාජිකයින් හත්දෙනෙකු සහිත 11 දෙනෙකුගෙන් පාලක සභාව සමන්විත වියයුතු වුවත්, 2012 වර්ෂ සඳහා ශ්‍රී ලංකා කර්මාන්ත උපදේශක සභාවේ සභාපතිවරයා, ජාතික සංවර්ධන බැංකුවේ සාමාන්‍යධිකාරිවරයා සහ වානිජ බැංකු සංගමයේ සභාපතිවරයා යන සාමාජිකයින් පත්කර නොතිබුණි.<br><br>මෙම ආයතන ක්‍රියාත්මක නොවන බැවින් අදාල පත්කිරීම් සිදු කිරීමට නොහැකි වී ඇති බවත් වර්තමානය වනවිට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනත සංශෝධනය කිරීමට පියවර ගෙන ඇති බවත් සභාපතිවරයා විසින් 2013 මාර්තු මාසයේදී මා වෙත දන්වා එවා තිබුණි. |
| (ආ) 2006 මැයි 30 දිනැති අංක 09/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | අධ්‍යක්ෂවරු දෙදෙනෙකු හා එක් අංශ ප්‍රධානි තනතුර දරන නිලධාරියෙකු සඳහා වේලා සටහන් යන්ත්‍රයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීමේදී, චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2011 මාර්තු 08 දිනැති අංක DMS/E4/47/7/276/1 දරන ලිපියේ සඳහන් ආයතනයේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ 5 වගන්තිය | කාර්ය මණ්ඩලය බඳවාගැනීමේදී ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම්වල නිවැරදිතාවය පිළිබඳ විභාග දෙපාර්තමේන්තුවෙන් තහවුරුවක් ලබාගෙන නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ**<br><br>(i) 2010 දෙසැම්බර් 14 දිනැති අංක PED 55 දරන චක්‍රලේඛය | <br><br>විගණන හා කළමනාකරණ කමිටුව සඳහා භාණ්ඩාගාර නියෝජිතයකු පත්කලයුතු වුවත් ආයතනය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරණ චක්‍රලේඛය 7.4.5 වගන්තිය | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතු වුවත් ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් බදුවලට පසු රු.380,802,552 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදුවලට පසු ශුද්ධ අතිරික්තය රු.244,475,986 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු 136,326,566 කින් වැඩි වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් ආදායම, පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 32 කින් වැඩි වී තිබූ අතර බදු වලට පසු ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 56 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| | 2012 | 2011 | විචලනය | |
|---|---|---|---|---|
| | රු.මි. | රු.මි. | රු.මි. | ප්‍රතිශතය |
| මෙහෙයුම් ආදායම | 957.073 | 726.561 | 230.51 | 32 |
| විකුණුම් පිරිවැය | 340.208 | 281.539 | 58.67 | 21 |
| දල ලාභය | 616.865 | 445.022 | 171.84 | 39 |
| මෙහෙයුම් ලාභය | 420.486 | 291.822 | 128.66 | 44 |
| මූල්‍ය වියදම | .796 | .170 | .63 | 371 |
| මූල්‍ය ආදායම | 1.520 | 1.402 | .12 | 9 |
| බදුවලට පෙර ලාභය | 421.210 | 293.054 | 128.16 | 44 |
| බදුවලට පසු ලාභය | 380.803 | 244.476 | 136.33 | 56 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

ආයතනයේ ස්ථිර තනතුරු දරන උපදේශකයන් 13 දෙනෙකු 2012 ජනවාරි මස සිට 2012 සැප්තැම්බර් මස දක්වා කාලය තුළදී ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීම හා පිටවීම සටහන් කොට රාජකාරි කාලය තුළදී ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යායතනයේ පැය 887.75 ක් දේශන පවත්වා තිබුණි. දැනට මෙම දේශන කාලය අවම කර ඇති බව සභාපතිවරයා විසින් 2014 මාර්තු මාසයේදී දන්වා එවා තිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

උපාධි පාඨමාලා ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය විසින් පවත්වාගෙන යන බැවින් සමාලෝචිත වර්ෂයේ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ එක් එක් අංශයන්හි මෙහෙයුම් ආදායම පෙර වර්ෂයේ ආදායම සමග සැසඳීමේදී සියයට 17 සිට සියයට 25 අතර ප්‍රතිශතයකින් අඩු වී ඇති බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| අංශය | 2012 | 2011 | අඩු වූ ප්‍රමාණය | අඩු වූ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මි. | රු.මි. | රු.මි. | |
| කළමනාකරණ පුහුණු හා එලදායිතා | 285.881 | 345.703 | 59.822 | 17 |
| පරිගණක පුහුණු | 229.135 | 304.522 | 75.388 | 25 |
| භාෂා | 54.060 | 71.635 | 17.576 | 25 |

## 4.3 හඳුනාගන්නා ලද පාඩු

ආයතනයේ යාපනය ශාඛාව වසා දැමීම නිසා එම ශාඛාව සතුව පැවති ගොඩනැගිල්ලෙන් ඉවත් කරන ලද කොටස් විකිණීමෙන් රු. 5,243,000 ක අලාභයක් සිදුවී තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ කළමනාකරණ හා තොරතුරු පද්ධති අංශයේ අධ්‍යක්ෂ තනතුර දරන නිලධාරිනිය ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනයේ පරිගණක අංශයේ අංශාධිපති ලෙස ද කටයුතුකර තිබූ බැව් විගණනයේදී නිරීක්ෂණය විය. ආයතනයේ ස්ථිර තනතුරක් දරන නිලධාරිනියක වෙනත් ආයතනයක ස්ථිර තනතුරක කටයුතු කිරීම සඳහා පාලක මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ 2012 වර්ෂය සඳහා වූ සංශෝධනය කළ ඒකාබද්ධ ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2013 දෙසැම්බර් 11 දිනදීය.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

(අ) මහනුවර ශාඛාව සඳහා නව ගොඩනැගිල්ලක් වර්ෂ 5 කාල පරිච්ඡේදයකට මසකට රුපියල් මිලියන 1.5 බැගින් රුපියල් මිලියන 90 ක බදු පදනම මත ලබාගැනීමට 2012 සැප්තැම්බර් 17 දින ගිවිසුමකට එළඹ තිබුණි. ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවූ ආරක්ෂණ තැන්පතු හා ගොඩනැගිල්ල නවීකරණය (partition) කිරීමට දරන ලද රු.26,668,360 ක වියදම් සම්බන්ධයෙන් 2012 වර්ෂයේ අයවැය ලේඛනයේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පර්යේෂණ හා සංවර්ධන වියදම් ලෙස රු.2,000,000 ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණද එයින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ දුර්වලතා වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) පාඨමාලා පැවැත්වීම

(ඇ) මානව සම්පත් කළමනාකරණය

එච්.ඒ.එස්. සමරවීර

විගණකාධිපති

# හැඳින්වීම

ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සවිස්තරාත්මක ප්‍රතිපත්ති ප්‍රකාශයක් මේ ප්‍රකාශණයේ ඇතුලත් වේ. මේ වනාහී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව පිලියෙල කරන ලද ප්‍රථම මූල්‍ය ප්‍රකාශනයයි. (ශ්‍රී. ලං. මු. වා. ප්‍ර. සහ ශ්‍රී. ලං. ගි. ප්‍ර.)

සම්පූර්ණ මූල්‍ය  ප්‍රකාශ කට්ටලයක් පිළියෙල කිරීමේදී සහය වන ආදර්ශ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් වාර්තාවේ අන්තර්ගතය.

සමස්ත මූල්‍ය  ප්‍රකාශ කට්ටලය පහත දැයින් සමන්විතය.

සමූහයේ  මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය.

සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය පිළිබඳ ප්‍රකාශය.

සමූහයේ ව්‍යාපාර වස්තු වල වෙනස්කම් පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය.

සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

සමූහයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ නිරූපණාත්මක සටහන්.

ශ්‍රී ලං මු රෙ -1 ට අනුකූල වන පරිදි ආයතනය විසින් ඉදිරිපත් කල යුතු ශේෂ පත්‍ර සැසඳුම්ද මෙම වාර්තාවේ ඇතුළත් වේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පලමු වරට අදාල කර ගැනීම සහ අදාල සටහන්.

# ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමූහයේ මූල්‍ය ප්‍රකාශයන්

## පටුන

සමූහයේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

සමූහයේ සවිස්තරාත්මක ආදායම් පිළිබඳ ප්‍රකාශය
(කාර්ය පිරිවැය මගින් විග්‍රහ කරන ලද ඒකල ප්‍රකාශ ප්‍රවේශය)

සමූහයේ ව්‍යාපාර වස්තු වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ වල කොටසක් වශයෙන් ඒකාබද්ධ සටහන්

# ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය
## වාර්ෂික ගිණුම් - 2012
## 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| සටහන් | NIBM 2012 | ඒකාබද්ධ 2012 | NIBM 2011 | ඒකාබද්ධ 2011 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ - 4 | 839,832,741 | 1,115,848,545 | 873,884,994 | 1,002,991,754 |
| අස්පෘශ්‍ය වත්කම් - 5 | 127,123 | 127,123 | 190,685 | 190,685 |
| අනුබද්ධ ආයතනවල ආයෝජනය - 6 | 350,000,010 | | 250,000,000 | |
| විලම්භිත බදු වත්කම් -7 | - | | - | - |
| වෙනත් ජංගම නොවන වත්කම් | 8,701,687 | 8,701,687 | 5,678,490 | 5,678,490 |
| | **1,198,661,561** | **1,124,677,355** | **1,129,754,169** | **1,008,860,929** |
| **ජංගම වත්කම්** | | | | |
| බඩු වට්ටෝරු - 8 | 8,966,556 | 11,588,354 | 6,959,521 | 7,020,602 |
| කල් පිරෙන දිනට පැවති මූල්‍ය වත්කම් -9 | 115,000,000 | 465,000,000 | 128,000,000 | 128,000,000 |
| වෙළෙඳාම් සහ අනෙකුත් ලැබීම් - 10 | 91,408,020 | 125,655,022 | 81,767,554 | 101,348,295 |
| අනෙකුත් මූල්‍ය නොවන වත්කම් | 1,975,039 | 1,975,039 | 1,705,390 | 1,705,390 |
| මුදල් හා බැංකු සේවා - 11 | 13,069,348 | 46,295,328 | 23,123,625 | 179,779,394 |
| | **230,418,963** | **650,513,742** | **241,556,090** | **417,853,680** |
| **මුළු වත්කම්** | **1,429,080,524** | **1,775,191,097** | **1,371,310,259** | **1,426,714,609** |
| **අරමුදල් සහ බැරකම්** | | | | |
| **ප්‍රදාන** | | | | |
| රජයේ ප්‍රදාන - 12 | **57,175,766** | **57,175,766** | **57,175,766** | **57,175,766** |
| ප්‍රාග්ධන හා සංචිත | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | | | |
| ප්‍රත්‍යගණන සංචිත - 13 | 152,048,873 | 152,048,873 | 154,111,157 | 154,111,157 |
| රඳවාගත් ඉපැයුම් - 14 | 569,328,692 | 730,082,138 | 348,582,156 | 346,712,506 |
| | **721,377,565** | **882,131,011** | **502,693,313** | **500,823,663** |
| වෙනත් ආධාර - 15 | 1,068,000 | 1,068,000 | 1,068,000 | 1,068,000 |
| ප්‍රාග්ධන ආධාර - 16 | 386,359,248 | 386,359,248 | 394,650,728 | 394,650,728 |
| | **387,427,248** | **387,427,248** | **395,718,728** | **395,718,728** |
| ජංගම නොවන බැරකම් | | | | |
| පුස්තකාල තැන්පතු | 4,557,000 | 5,352,000 | 5,460,000 | 5,460,000 |
| විලම්භිත බදු බැරකම් -7 | 11,846,602 | 13,229,351 | 10,557,204 | 10,557,204 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැරකම් - 17 | 15,910,635 | 15,910,635 | 15,635,833 | 15,635,833 |
| ජංගම නොවන බැරකම් | | | | |
| | **32,314,237** | **34,491,986** | **31,653,037** | **31,653,037** |
| ජංගම බැරකම් | | | | |
| වෙළෙඳ හා වෙනත් -18 | 174,912,097 | 353,914,874 | 326,880,369 | 384,154,369 |
| ජංගම බදු බැරකම් -19 | 22,000,000 | 26,176,601 | 23,000,000 | 23,000,000 |
| ප්‍රතිපාදන - 20 | 33,873,611 | 33,873,611 | 34,189,046 | 34,189,046 |
| | **230,785,708** | **413,965,086** | **384,069,415** | **441,343,415** |
| මුළු අරමුදල් හා බැරකම් | **1,429,080,524** | **1,775,191,097** | **1,371,310,259** | **1,426,714,609** |

2011 ඔක්තෝබර් 07 සිට 2012 දෙසැම්බර් 31 දක්වා NSBM ගිණුම්

**ආචාර්ය ඊ.ඒ. වීරසිංහ**
**අධ්‍යක්ෂ ජනරාල්**

**ජී.ඩී. බර්නාඩ්**
**අධ්‍යක්ෂ මූල්‍ය**

# ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය
# ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | | 'YEAR ENDED 31 DECEMBER | | 'YEAR ENDED 31 DECEMBER | |
|---|---|---|---|---|---|
| | | NIBM 2012 | ඒකාබද්ධ 2012 | NIBM 2011 | ඒකාබද්ධ 2011 |
| අයභාරය | 21 | 575,224,265 | 957,073,238 | 726,561,415 | 726,561,415 |
| විකුණුම් පිරිවැය | 22 | 170,198,648 | 340,208,165 | 281,406,386 | 281,539,192 |
| දළ ලාභය | | **405,025,617** | **616,865,073** | **445,155,030** | **445,022,224** |
| වෙනත් ආදායම් | 23 | 41,030,274 | 61,635,042 | 24,965,650 | 24,965,650 |
| ව්‍යාපෘති පිරිවැය | | | | | |
| පරිපාලන වියදම් | 24 | 201,328,584 | 256,226,199 | 175,526,796 | 177,262,140 |
| වෙනත් වියදම් | 25 | 399,160 | 1,787,957 | 903,647 | 903,647 |
| මෙහෙයුම් ආදායම | | **244,328,146** | **420,485,959** | **293,690,236** | **291,822,086** |
| මූල්‍ය පිරිවැය | 26 | 105,980 | 796,074 | 168,427 | 169,927 |
| මූල්‍ය ආදායම | | 1,519,644 | 1,519,644 | 1,402,040 | 1,402,040 |
| ආදායම් බදුවලට පෙර ශුද්ධ ලාභය | | **245,741,810** | **421,209,529** | **294,923,849** | **293,054,199** |
| ආදායම් බදු වියදම් | 27 | (27,562,354) | (40,406,977) | (48,578,213) | (48,578,213) |
| වසර සඳහා ශුද්ධ ලාභය | | **218,179,456** | **380,802,552** | **246,345,636** | **244,475,986** |

2011 ඔක්තෝබර් 07 සිට 2012 දෙසැම්බර් 31 දක්වා NIBM ගිණුම්

# ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය
# ඒකාබද්ධ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | අනෙකුත් සංචිත | රඳවාගත් ඉපැයුම් | රජයේ ආධාර වෙනත් මාරුවීම් | අනෙකුත් ගැළපුම් | පූර්ව වසර ගැළපුම් | NIBM | ඒකාබද්ධ |
|---|---|---|---|---|---|---|---|
| **2011 ජනවාරි 01 දිනට වන වසර සඳහා ලාභය** | | 99,193,323 | | | | 99,193,323 | 99,193,323 |
| රඳවාගත් ඉපැයුම් වෙත ගැළපුම් | | | | 3,043,197.33 | | 3,043,197 | 3,043,197 |
| වසරේ ලාභය | | 246,345,636 | | | | 246,345,636 | 244,475,986 |
| 2011 දෙසැම්බර් 31 දිනට | | 345,538,959 | | | | 348,582,156 | 346,712,506 |
| ඉවත් කළ වත්කම් සඳහා ප්‍රත්‍යාගණන වටිනාකම<br>පූර්ව වසර ගැළපුම් | | 2,062,283 | | | | 2,062,283<br>- | 2,062,284 |
| ආයෝජන මත පොළී<br>2012 දෙසැම්බර් 31 දිනට | | | | 504,796 | | 504,796 | 504,796 |
| වසර තුළ ලාභය<br>වසර සඳහා මුළු පර්යාප්ත ආදායම | | 218,179,456 | | | | 218,179,456 | 380,802,552 |
| 2012 දෙසැම්බර් 31 දිනට | - | 565,780,698 | - | 504,796 | - | 569,328,691 | 730,082,138 |

# ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය
# ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| | NIBM 2012 | ඒකාබද්ධ 2012 | NIBM 2011 | ඒකාබද්ධ 2011 |
|---|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | | | |
| වසර සඳහා සැලසුම් කළ අතිරික්තය | 210,129,848 | 361,987,521 | 278,217,478 | 276,347,828 |
| **අරමුදල් සංචලනය හා සම්බන්ධ නොවන අයිතමන් සඳහා ගැළපුම්** | | | | |
| ක්ෂය වීම් | 56,363,520 | 66,092,005 | 48,637,580 | 48,637,580 |
| **ස්ථාවර වත්කම් විකුණුමෙන් ශුද්ධ (ලාභය)/අලාභය** | 3,091,079 | 3,091,079 | (105,269) | (105,269) |
| | 269,584,447 | 431,170,605 | 326,749,789 | 324,880,139 |
| පාරිතෝෂික ගෙවීම් | (626,191) | (626,191) | (2,456,322) | (2,456,322) |
| ආදායම් බදු ගෙවීම් | (26,272,955) | (34,940,977) | (48,718,534) | (48,718,534) |
| කාරක ප්‍රාග්ධන අයිතම වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය | 242,685,301 | 395,603,437 | 275,574,933 | 273,705,283 |
| පුස්තකාල තැන්පතුවල (අඩුවීම)/වැඩිවීම | (903,000) | (108,000) | 945,000 | 945,000 |
| විශ්‍රාම ප්‍රතිලාභවල (අඩුවීම)/වැඩිවීම | 280,814 | 1,663,563 | 1,430,379 | 1,430,379 |
| | 242,063,115 | 397,159,000 | 277,950,312 | 276,080,662 |
| **කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම්** | | | | |
| බඩු වට්ටෝරුවල අඩුවීම/(වැඩිවීම) | (2,007,034) | (4,567,751) | (1,391,960) | (1,453,041) |
| වෙළෙඳ හා වෙනත් ලැබීම් අඩුවීම/(වැඩිවීම) | (6,347,620) | (30,506,110) | (28,828,242) | (48,408,982) |
| වෙළෙඳ හා වෙනත් ගෙවීම් (අඩුවීම)/වැඩිවීම | (151,968,271) | (20,747,266) | 95,831,675 | 153,105,675 |
| ජංගම බදු බැරකම්වල (අඩුවීම)/වැඩිවීම | (1,000,000) | (1,000,000) | | |
| ප්‍රතිපාදනයන්ගේ (අඩුවීම)/වැඩිවීම | (315,435) | (315,435) | 6,765,542 | 6,765,542 |
| | 80,424,755 | 340,022,438 | 350,327,327 | 386,089,856 |
| ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ | | | | |
| ආයෝජන මත ලැබුණු පොලී | 21,859,764 | 45,469,809 | 11,036,470 | 11,036,470 |
| ස්ථාවර වත්කම් විකිණීම | (30,402,252) | (106,400,456) | (60,595,438) | (172,595,438) |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (100,000,010) | | (250,000,000) | |
| ආයෝජන - NSBM | | (80,639,323) | | (17,106,760) |
| ආයෝජන - WIP | 5,063,466 | 5,063,466 | 105,670 | 105,670 |
| | (23,054,277) | 203,515,934 | 50,874,029 | 207,529,798 |
| මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ | | | | |
| සාමාන්‍ය කොටස් නිකුත් කිරීම | | | | |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන - 1) | **151,123,625** | **307,779,394** | **100,249,596** | **100,249,596** |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන 2) | **128,069,348** | **511,295,328** | **151,123,625** | **307,779,394** |
| **සටහන 1** | | | | |
| බැංකු ශේෂය | 19,556,780 | 175,248,549 | 9,631,583 | 9,631,583 |
| අත ඇති මුදල් | 3,566,845 | 4,530,845 | 618,013 | 618,013 |
| කෙටිකාලීන තැන්පතු | 128,000,000 | 128,000,000 | 90,000,000 | 90,000,000 |
| | **151,123,625** | **307,779,394** | **100,249,596** | **100,249,596** |
| **සටහන 2** | | | | |
| බැංකු ශේෂය | 11,826,648 | 42,781,128 | 19,556,780 | 175,248,549 |
| අත ඇති මුදල් | 1,242,700 | 3,514,200 | 3,566,845 | 4,530,845 |
| කෙටිකාලීන තැන්පතු | 115,000,000 | 465,000,000 | 128,000,000 | 128,000,000 |
| | **128,069,348** | **511,295,328** | **151,123,625** | **307,779,394** |

## සටහන් අංකය

1. සංයුක්ත තොරතුරු
2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති
3. අවදානම් කළමණාකරනය
   ශ්‍රී ලං ගි ප්‍ර මුල් වරට අදාල කරගැනීම(ශ්‍රී ලං මු වා ප්‍ර සහ ශ්‍රී ලං ගි ප්‍ර)
4. දේපල පිරියත සහ උපකරණ
5. අස්පෘෂ්‍ය වත්කම්
6. ආයෝජන(ශ්‍රී ලං ව්‍යා ක පා)
7. විලම්බිත බදු වත්කම් සහ වගකීම්
8. බඩු වට්ටෝරු පොත්
9. කල් පිරෙන තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්
10. වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ
11. මුදල් සහ මුදල් සමාන දේ
12. රජයේ ප්‍රදාන
13. ප්‍රති අගැයුම් සංචිතය
14. ආදායම් සහ වියදම් ශේෂ
15. අනෙකුත් ප්‍රදාන
16. ප්‍රාග්ධන ප්‍රදාන
17. සේවක ප්‍රතිලාභ වගකීම
18. වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේ
19. ජංගම බදු වගකීම්
20. ප්‍රතිපාදන
21. ආදායම
22. අලෙවි පිරිවැය
23. අනෙක් ආදායම්
24. පරිපාලන වියදම්
25. අනෙක් වියදම්
26. මූල්‍ය ගාස්තු
27. ආදායම් බදු
28. අත්හිටුවන ලද මෙහෙයුම්
29. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පලමු වරට අදාල කර ගැනීම

## මූල්‍ය පහසුකම් සඳහා වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 **සංයුක්ත විස්තරය**

1.1 **නෛතික හා නිත්‍ය ආකෘතිය**

1991 අංක 21 දරන සංශෝධන පනතින් සංශෝධිත 1976 අංක 23 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ස්ථාපිත කරන ලදී. එය පිහිටා ඇත්තේ අංක 120/5, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයෙහි ය.

1.2 **ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය.**

වසර පුරා ආයතනයේ කාර්යයන් පහත පරිදි වේ.

ගුණාත්මක ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනයේ හා ආශ්‍රිත ක්ෂේත්‍රයන් සඳහා උපදෙස් සැපයීම.
සංවිධානවල කළමනාකරුවන් හා අධීක්ෂණ කාර්යමණ්ඩල නිපුණතා සංවර්ධනය
සංවිධානවල සේවකයන් පුහුණු කිරීම හා ඔවුන්ට අධ්‍යාපනය ලබාදීම.
සංවිධානවල ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැපයීම.
කළමනාකරණ උපදේශන හා උපදේශක සේවාවන් සැපයීම.

1.3 **නිකුත් කිරීම සඳහා බලාධිකාරී දිනය**

2012 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම සඳහා පාලක සභාව විසින් 2013.07.25 දින අවසර ලබා දෙන ලදී. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ඒකාබද්ධ ගිණුම් නිකුත් කිරීම සඳහා පාලක සභාව විසින් අවසර ලබා දෙන ලද්දේ 2013 ඔක්තෝබර් මස දී ය.

1.4 **මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම.**

මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සඳහා වගකියනු ලබන්නේ පාලක සභාවයි. මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධව පාලක සභාවේ වගකීම, 'පාලක සභාවේ වගකීම් ප්‍රකාශය' තුළ දක්වේ.

2. **අදාළ වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

2.1 **පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

2.1.1 **මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLFRS/LKAS)අනුව මූල්‍ය ප්‍රකාශන සකසා ඇත.

2011 දෙසැම්බර් 31 වන දා තෙක් ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLAS) වලට අනුකූලව, 2011 දෙසැම්බර් 31 අවසන් වූ වසර තෙක්, එම වසර ද ඇතුළත්ව, වන කාලසීමාව සඳහා මූල්‍ය ප්‍රකාශනයන් ආයතනය මගින් සකසන ලදී.

2012 ජනවාරි 01 හෝ ඉන් පසු සඳහා ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) වලට අනුකූලව ආයතනය මගින් සකසන ලද ප්‍රථම මූල්‍ය ප්‍රකාශන වන්නේ, 2012 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයි. (මෙම වෙනස සඳහා වන පැහැදිලි කිරීම හා සටහන 29 බලන්න.)

2011 ජනවාරි 01 වන දිනට වන මූල්‍ය තත්ත්වය පිළිබඳව වන පළමු SLFRS ප්‍රකාශය

සැකසීම සඳහා භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, නිරතුරුව ක්‍රියාත්මක වූ ආකාරයෙන්, ඉදිරිපත් කර ඇති සියලුම කාල සීමාවන් සඳහා යොදාගෙන ඇත.

ආයතනයේ වර්තාගත මූල්‍ය තත්ත්වය හා මූල්‍ය කාර්යසාධන සඳහා SLFRS වෙත වෙනස්වීම බලපෑ ආකාරය පිළිබඳ පැහැදිලි කිරීමක් සටහන 29 මගින් සපයා ඇත.

### 2.1.2 ඇගයීමේ පදනම

වෙළෙඳපොළ වටිනාකම මත සමහර වත්කම් හා බැරකම් හැර මූලය ප්‍රකාශන සකසනු ලැබ තිබෙන්නේ ඓතිහාසික පිරිවැය පදනම මතයි.

### 2.1.3 ව්‍යවහාර මුදල් හා ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශනවල ඇති අයිතමයන් මැන ඇත්තේ ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්තික පරිසරය තුළ ඇති මුදල්වලිනි. (ව්‍යවහාර මුදල්) මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කර ඇත්තේ ආයතනයේ ව්‍යවහාර හා ඉදිරිපත්කිරීමේ මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලිනි.

### 2.1.4 අනුකූලතා ප්‍රකාශය

2012 දෙසැම්බර් 31 දිනට වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තරාත්මක ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් ('මූල්‍ය ප්‍රකාශන') යනාදිය සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS හා SLFRS)වලට අනුකූලව ය.

### 2.1.5 ප්‍රවර්තන ව්‍යාපාරය

පාලක සභාවේ සාමාජිකයන්, ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස පැවතීමට ආයතනයේ හා එහි ඇති හැකියාව තක්සේරු කර ඇති අතර එහි වාණිජ කටයුතු ඇවර කිරීමට හෝ නැවැත්වීමට අදහස් නොකරයි.

### 2.1.6 සන්සන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ආයතනය මගින් සමානුයෝගීව භාවිතා කරන අතර පෙර වසර සමඟ ද අනුකූල වේ. වත්මන් වසරේ ඉදිරිපත්කිරීම/වර්ගීකරණය හා අනුගත වීම පිණිස පෙර වසරේ සංඛ්‍යා හා ස්ථානවල අවශ්‍ය පරිදි වෙනස්කම් සිදුකර ඇත.

### 2.1.7 ද්‍රව්‍යාත්මක හා සමාහාර බව

සමාන අයිතමයන්ගේ ද්‍රව්‍යාත්මක වර්ග වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර ඇත. ද්‍රව්‍යාත්මක නොවන ද්‍රව්‍ය නොවන්නේ නම් එකිනෙකට වෙනස් අයිතමයන් වෙනමම දක්වා ඇත.

### 2.1.8 අදාළ වන ගිණුම් විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී, ආදායම් වියදම් සම්පත් හා බැරකම්වල වාර්තාගත ප්‍රමාණයට බලපාන හා වාර්තා කරන දිනය වන විට ඇති අනිශ්චිත බැරකම් අනාවරණය සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන යනාදිය ඇති කර ගැනීමට කළමනාකාරීත්වයට සිදුවේ.

මීළඟ මූල්‍ය වර්ෂයේ වත්කම් හා බැරකම් ප්‍රමාණවලට ද්‍රව්‍යාත්මක ගැලපුම් සිදුකිරීමේ අවදානමක් ඇති කරන මූල්‍ය තත්ත්ව දිනයට අදාළ ඇස්තමේන්තු අනිශ්චිතතාවයන්ගේ ප්‍රධාන මූලාශ්‍ර සහ අනාගතයට බලපාන ප්‍රධාන උපකල්පනයන් අවධානයට ගැනිණි.

## 2.2 වත්කම් තක්සේරු කිරීමේ පදනම

### 2.2.1 දේපළ, පිරියත හා උපකරණ

#### (අ) ඇගයීම

දේපළ, පිරියත හා උපකරණයන්හි සියලු අයිතමයන් මූලිකව පිරිවැය මත වාර්තා කර ඇත. දේපළ පිරියත හා උපකරණයන්හි අයිතමයන් ප්‍රත්‍යාගණනය කර ඇති විටක, එම වත්කම්වල සමස්ත වර්ගයට

ප්‍රත්‍යාගණනය කරනු ලැබ ඇත. එදිනෙදා සේවා, සමුච්ඡිත ක්ෂයවීම් අවමය හා සමුච්චිත හානිකරන සඳහා පිරිවැය හැරුණුකොට දේපළ, පිරියත හා උපකරණ පිරිවැය මත ප්‍රකාශ කොට ඇත. (පුස්තකාල පොත් සඳහා පමණක්) අනෙකුත් පූර්ණ ක්ෂය වූ වත්කම් 2013 දී නැවත ප්‍රකාශ වනු ඇත.

වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට ඉදිරියට රැගෙන යන ප්‍රමාණයේ ඕනෑම වැඩිවීමක්, එය නැවත වියදමක් නොවන්නේ නම්, ඍජුවම ප්‍රත්‍යාගණිත අතිරික්තය වෙත බැර කෙරේ. එවැනි තත්ත්වයක් යටතේ දී පෙර ලියා තබන ලද වටිනාකමෙහි තරමට එම වැඩිවීම ආදායමක් ලෙස ගණන් ගැනේ. කිසියම් වත්කමක ඉදිරියට ගෙන ආ වටිනාකම ප්‍රත්‍යාගණනයක් හේතුවෙන් අඩු කරනු ලබන්නේ නම් එම අඩු කිරීම වත්කමට අදාළව පැවති පූර්ව වැඩිකිරීමක් ප්‍රතිවර්තනය නොවන්නේ නම් එවිට අදාළ අඩුකිරීම වියදමක් සේ හඳුනා ගැනේ. එවන් අවස්ථාවක දී එකී වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි රඳවා ගනු ලබන වටිනාකම ඉක්මවා අඩු කිරීම නොයන දුරට ප්‍රත්‍යාගණන අතිරික්තය අය කෙරේ. වත්කමක් සම්බන්ධයෙන් වන ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි පවත්නා ශේෂයන් ඍජුවම වත්කම් අපහරණය හෝ අභාවිතය මත සමුච්චිත ලාභ හෝ අලාභයට ඍජුවම මාරු කෙරේ.

**(ආ) දේපළ, පිරියත හා උපකරණයන්හි ඵලදායී ජීවිත කාලයන්**

වත්කම්වල සුන්බුන් අගයන්, එක් එක් වාර්තා කෙරෙන දිනයන් වන විට වත්කම්වල ඵලදායී ජීවිත කාලයන් හා ක්ෂයවීම් ක්‍රමයන්; මෙම අගයන් ඇස්තමේන්තු කිරීමේ දී වෘත්තීයමය නිපුණතාවය මත පදනම්ව කළමනාකරණය ගනු ලැබූ විනිශ්චයන්, අනුපාත හා ක්‍රමවේදයන් යනාදිය ආයතනය මගින් විග්‍රහ කෙරේ.

**(ඇ) ක්ෂය වීම**

වත්කම මත රඳා පවතින අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව පිළිබිඹු කරන බැවින් දේපළ, පිරියත හා උපකරණයන්හි එක් එක් අයිතමයන්ගේ ඵලදායී ජීවිත කාලය මත තබමින් ලාභ අලාභ ක්ෂය වීම් හඳුනාගෙන ඇත.

සින්නක්කර ඉඩම් ක්ෂය නොවේ.

ආර්ථිකමය ඵලදායී ජීවිත කාලයන් පහත පරිදි ය.

| | |
|---|---|
| අස්පෘශ්‍ය වත්කම් | 33 ⅓% |
| ගොඩනැගිලි ඉදිකිරීම් | 2% |
| නවීකරණය | 10% |
| -සීලිංපංකා | 25% |
| ගිනි නිවන | 20% |
| ගෘහභාණ්ඩ හා උපකරණ | 20% |
| කාර්යාලීය උපකරණ | 20% |
| බයිසිකල් | 25% |
| පරිගණක උපකරණ | 25% |
| මෝටර් වාහන | 25% |
| යතුරුපැදි | 25% |
| පුස්තකාල පොත් | 20% |

භාවිතා කිරීම සඳහා වත්කම් ලබාගත හැකි විට ක්ෂයවීම ඇරඹෙන අතර විකිණීම සඳහා තබා ඇති බවට වර්ගීකරණය කෙරෙන දිනයේ දී හා වත්කම ඉවත් කිරීම සඳහා නැවත හඳුනා ගැනෙන දිනයේ දී ක්ෂයවීම අවසන් වේ.

**(ඈ) ප්‍රතිසම්පාදන පිරිවැය**

දේපළ පිරිසක හා උපකරණයන්ගේ මුල්වරට හඳුනාගන්නා ලද අනාගත ආර්ථිකමය ප්‍රතිලාභ ප්‍රමිතිය පවත්වාගෙන යාමට හෝ එය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය වන වියදම, වියදමක් ලෙස හඳුනා ගැනේ.

**(ඉ) ඉවත් කිරීම සඳහා නැවත හඳුනාගැනීම**

දේපළ, පිරිසක හා උපකරණයන්හි අයිතිමයක් ඉවත් කිරීම සඳහා හඳුනා ගැනෙන්නේ අපහරණය කිරීමේ දී හෝ එය භාවිතයෙන් හෝ අපහරණයෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොලැබෙන විටදී ය. යම් වත්කමක් ඉවත් කිරීම සඳහා

හඳුනා ගැනීම තුළින් පැන නගින ලාභයක් හෝ අලාභයක් වත්කමේ ශුද්ධ අපහරණ අගය හා රැගෙන යනු ලබන අගය අතර වෙනස ලෙස ගණනය කිරීමෙන්) වත්කම ඉවත් කිරීම සඳහා හඳුනා ගන්නා වසරේ විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය තුළට එක් කරනු ලැබේ.

**2.2.2 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ**

වත්කම පළමු වරට උපයෝජනය කරන අවස්ථාවේ දී කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ අදාළ වත්කම් ගිණුම් වෙතට මාරු කෙරේ.

**2.2.3 අස්පෘෂ්‍ය වත්කම්**

**(අ) හඳුනාගැනීමේ පදනම**

අස්පෘශ්‍ය වත්කමක් යනු භෞතික පැවැත්මක් නොමැති හඳුනාගත හැකි අමූල්‍ය වත්කමකි. හඳුනාගත හැකි බව පැන නැඟෙන්නේ අදාළ වත්කම තවත් කළ හැකි හෝ කොන්ත්‍රාත් හෝ අනෙකුත් නෛතික හිමිකම් වෙතින් පැන නැගෙන විට ය. අස්පෘෂ්‍ය වත්කමක් හඳුනාගත හැක්කේ වත්කමට ආරෝපණය වන අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලායාමේ විභව්‍යතාවක් තිබෙන්නේ නම් පමණි. එසේම වත්කමේ පිරිවැය විශ්වාසී අයුරින් මිනිය හැක්කේ අස්පෘෂ්‍ය වත්කම් පිළිබඳ KLAS 38 අනුව ය. ආයතනයෙහි අස්පෘෂ්‍ය වත්කම්වලට ඇතුළත් වනුයේ පරිගණක දෘඩාංගයන්හි සමස්ත කොටසක් නොවන ආයතනය විසින් භාවිතය සඳහා අවසරලත් පිරිවැයක් සහිත පරිගණක මෘදුකාංගයන් ය.

**(ආ) ගිණුම් පදනම**

වෙන් වෙන් වශයෙන් අත්පත් කරගන්නා අස්පෘෂ්‍ය වත්කම්හි වටිනාකම් මනිනු ලබන්නේ හඳුනා ගන්නා ලබන ආරම්භක පිරිවැයට ය. ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අස්පෘෂ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කළ පිරිවැයට සහ සමුච්චිත හානිකරණ පාඩුවක් තිබෙන්නේ නම් ඒ අනුව ඉදිරියට ගෙන යනු ලැබේ. ආයතන අභ්‍යන්තරයේ උත්පාදනය කරනු ලබනා අස්පෘෂ්‍ය වත්කම් ප්‍රාග්ධනගත නොකරන අතර වියදම එය පැන නැගුණ වසරේ ආදායම් ප්‍රකාශනයෙහි ඉදිරිපත් කෙරේ.

**(ඇ) ක්‍රමක්ෂය**

නිශ්චිත භාවිත කාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් සඵල ආර්ථික ජීව කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය ක්‍රමවේදයක් සඵල ජීව කාලයක් සහ වටිනාකම් අවම වශයෙන් සෑම වාර්තාකරන දිනයකදීම සමාලෝචනය කෙරේ.

**2.2.4 මූල්‍ය නොවන වත්කම් හානිකරණය.**

සෑම වර්ගීකරණ දිනයකදීම කිසියම් වත්කමකට හානිකරණයන් පිළිබඳ කිසියම් ලක්ෂණයක් තිබේ දැයි ආයතනය තක්සේරු කරයි. එවන් කිසියම් ලක්ෂණයක් තිබේ නම් හෝ කිසියම් වත්කමකට වාර්ෂික හාකිකරණ පරීක්ෂාවක් අවශ්‍ය නම් ආයතනය වත්කමහි යළි අය කර ගත හැකි ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවක් සකසයි. වත්කමක යළි අයකර ගත හැකි වටිනාකම යනු වත්කමේ උපරිම අගය හෝ වෙළෙඳ ඒකකයෙහි ශුද්ධ වටිනාකම එක් එක් වත්කමෙහි වටිනාකම මත තීරණය කරන අතර එසේ නොවන විටෙක දී සමූහයේ වත්කම් හෝ අනෙකුත් වත්කම් මත ස්වාධීනව විශාල මුදල් ප්‍රවාහයක් ගලා ඒමේ ස්වරූපයක් නොතිබිය යුතු ය. වත්කමක ඉදිරියට ගෙන ආ වටිනාකම යළි අයකර ගත හැකි වටිනාකම ඉක්මවන්නේ නම් වත්කම හානිකරණ වූවා සේ සැලකෙන අතර එය යළි අයකර ගත හැකි වටිනාකමට සටහන් කෙරේ. සඵල වටිනාකම තක්සේරු කිරීමේ දී වත්කමෙහි අවදානම් විශේෂතා සහ මුදලේ කාලීන වටිනාකම නිරූපණය කෙරෙන වර්තමාන වෙළෙඳපොළ තක්සේරුව පිළිබිඹු වන පෙරබදු වට්ටම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් එහි වර්තමාන වටිනාකමට වට්ටම් කෙරේ.

අඛණ්ඩව මෙහෙයුම්හි හානිකරණ පාඩු ප්‍රත්‍යාගණනය ව්‍යාපාර වස්තුවට ගනු ලබන අවස්ථාවේ පූර්වයෙන් ප්‍රත්‍යාගණිත දේපළ හැර හානිකරණ වත්කම් ක්‍රියාකාරිත්වයට අනුගත වන වියදම් වර්ගකීකරණයන් තුළ විස්තීර්න ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. මෙහිදී හානිකරණය ද ව්‍යාපාර වස්තුව තුළ හඳුනාගනු ලබන්නේ කවර හෝ පෙර ප්‍රත්‍යාගනන අගයක් දක්වා ය. කීර්තිනාමය හැර අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් පෙර හඳුනාගනු ලැබූ හානිකරණ පාඩු තවදුරටත් නොපවතින්නේ ද හෝ අඩු වී ඇත්තේ ද යන්න පිළිබඳ කිසියම් සංඥාවක් වේ දැයි සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරුවක් කරනු ලැබේ. එවන් තත්ත්වයක් පවතී නම් ආයතනය යළි අය කරගතහැකි ප්‍රමානය පිළිබඳ ඇස්තමේන්තුවක් සකසයි.

පෙරදී හඳුනාගනු ලැබූ හානිකරණ පාඩුවක් වෙනස් කරනු ලබන්නේ අවසන්වරට හානිකරණ පාඩුවක් හඳුනාගත් දින පටන් වත්කම්හි යළි අයකර ගතහැකි වටිනාකම තීරණය කිරීම හා භාවිතා කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදුව ඇත්තේ නම් පමණි. තත්ත්වය එසේ වන්නේ නම් වත්කමේ ඉදිරියට ගෙන ආ වටිනාකම එහි යළි අය කරගත හැකි වටිනාකම දක්වා වැඩි කෙරේ. වත්කම සම්බන්ධයෙන් හානිකරණ පාඩුවක් හඳුනාගෙන නොමැත්තේ නම් වැඩකරන ලද ඉදිරියට ගෙන යන ලද වටිනාකම තීරණය කරනු ලබන්නේ වත්කම්හි ක්ෂය ශුද්ධ අගයත් හානිකරන පාඩු පූර්ව වර්ෂයත් සම්බන්ධයෙන් හඳුනාගැනීමෙන් පසුව ය. එවන් වෙනස් කිරීමක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

**2.2.5 මූල්‍ය උපකරණ**

**2.2.5.1 මූල්‍ය වත්කම්**

ආයතනය එහි මූල්‍ය වත්කම් පහත කාණ්ඩ යටතේ වර්ගීකරණය කරනු ලබයි: ණය හා ලැබීම්, කල් පිරෙන දිනට මූල්‍ය වත්කම් අත්කර ගැනීමේ අරමුණ මත වර්ගීකරණය පදනම් වේ. ආයතනය තම මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳව මූලික හඳුනාගැනීමේ දී තීරණය කරනු ලබන අතර මෙම තෝරාගැනීම සෑම වාර්තා කරන දිනයකදීම නැවත ඇගයීමක් සිදුකරයි.

ආයතනයේ මූල්‍ය වත්කම් සඳහා ස්ථිර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, මුදල් හා වෙළෙඳ හා අනෙක් ලැබීම් ද අයත් වේ.

**2.2.5.1.1 මූලික හඳුනාගැනීම හා ඇගයීම.**

